





ශ්‍රී ලංකා ගුවන් හමුදාව

இலங்கை விமானப் படை

SRI LANKA AIR FORCE

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2021

# 2021 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව
## ශ්‍රී ලංකා ගුවන් හමුදාව
## වියදම් ශීර්ෂ අංක 224

පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය | | 7 - 8 |
| **01 වන පරිච්ඡේදය** | | 9 |
| 1. | විධායක සාරාංශය | 9 |
| 1.1 | හැඳින්වීම | 9 - 10 |
| 1.2 | දැක්ම,මෙහෙවර හා මුඛ්‍ය හැකියාවන් | 10 - 11 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 11 |
| 1.4 | සංවිධාන සටහන | 12 |
| 1.5 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ විධායක අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන් | 13 - 22 |
| **02 වන පරිච්ඡේදය** | | 23 |
| 2. | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 23 |
| 2.1 | ප්‍රගතිය | 23 -29 |
| 2.1.1 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය | 30 |
| අ. | ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය | 30 - 32 |
| ආ. | ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය | 33 - 35 |
| ඇ. | ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය | 35 - 53 |
| ඈ. | සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය | 53 - 66 |
| ඉ. | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය | 67 - 68 |
| ඊ. | සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය | 69 - 75 |
| උ. | සැපයුම් අධ්‍යක්ෂකය | 76 |
| ඌ. | පරිපාලන අධ්‍යක්ෂකය | 76 |
| එ. | පුහුණු අධ්‍යක්ෂකය | 77 |
| ඒ. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය | 77 - 78 |
| ඔ. | සුභසාධන අධ්‍යක්ෂකය | 78 - 80 |
| ඕ. | දන්ත සෞඛ්‍ය සේවා කාර්යාලය | 81 - 82 |
| ඖ. | විනයාරක්ෂක අධ්‍යක්ෂකය | 83 - 85 |
| ක. | ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය | 86 - 88 |
| ඛ. | මාධ්‍ය අධ්‍යක්ෂකය | 89 - 91 |
| ග. | තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය | 91 - 93 |
| ඝ. | ක්‍රීඩා අධ්‍යක්ෂකය | 93 |
| ඞ. | ප්‍රාසාංගික කලා අධ්‍යක්ෂකය | 94 |
| ච. | විධායක බඳවාගැනීමේ කාර්යාලය | 94 |
| ද. | විධායක නීති දෙපාර්තමේන්තුව | 95 |

| | | |
|---|---|---|
| | න. අභ්‍යන්තර විගණන අංශය | 95 - 103 |
| | ප. විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය | 104 - 107 |
| | බ. ගුවන් හමුදා ක්‍රීඩා කවුන්සලය | 108 |
| | ම. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් අංශය | 108 - 109 |
| 2.1.2 | දීපව්‍යාප්තව පිහිටා ඇති ශ්‍රීලංගුහ මූලික කඳවුරු සහ කඳවුරු විසින් | |
| | ක්‍රියාත්මක කර ඇති සඳහන් ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් | 110 - 129 |
| 2.2 | ඉදිරි දැක්ම | 130 - 132 |
| **03 වන පරිච්ඡේදය** | | 133 |
| 3. | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය | 133 |
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 133 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය | 134 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 135 |
| 3.4 | මූල්‍ය තත්ත්වය පිලිබඳ සාරාංශ විශ්ලේෂණය | 136 - 144 |
| 3.5 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 145 |
| 3.6 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 146 |
| 3.7 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 146 |
| 3.8 | මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල | |
| | නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 147 - 148 |
| 3.9 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 148 |
| 3.10 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 149 - 164 |
| **04 වන පරිච්ඡේදය** | | 165 |
| 4. | කාර්යසාධන දර්ශක | 165 |
| 4.1 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන දර්ශකය | |
| | (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 165 - 169 |
| **05 වන පරිච්ඡේදය** | | 170 |
| 5. | තිරසාර සංවර්ධන අරමුණු (*SDGs*) සපුරාගැනීමේ කාර්යසාධනය | 170 - 173 |
| **06 වන පරිච්ඡේදය** | | 174 |
| 6. | මානව සම්පත් පැතිකඩ | 174 |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 174 - 179 |
| 6.2 | මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ | |
| | කාර්යසාධනය කෙරෙහි බලපෑම | 180 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 180 - 205 |
| **07 වන පරිච්ඡේදය** | | 206 |
| 7. | අනුකූලතා වාර්තාව | 206 - 213 |

**08 වන පරිච්ඡේදය** 214

8. විගණන හා කළමනාකරණ කමිටුව 214 - 216

9. සමාප්තිය 217

10. කෙටි යෙදුම් 218 -221

## ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් 2021 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව මා ඉතා අභිමානයෙන් යුක්තව ඉදිරිපත් කරමි. ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට හා 2021-2023 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා සංයුක්ත සැලැස්මට ද අනුකූල වෙමින් රජයට පැහැදිලි කිරීම සඳහා මෙම වාර්තාව උපකාරී වේ. 2021 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ජාතික ආරක්ෂාව පිළිබඳ උපාය මාර්ගයන් ද එහි ඇතුළත් වේ. 2021 මූල්‍ය වර්ෂය සඳහා බදු ගෙවන්නන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරනු ලැබූ සම්පත්වල කළමනාකාරීත්වය සාමාන්‍ය ජනතාවට ඉදිරිපත් කිරීමේ මෙවලමක් ලෙස මෙන්ම, එම සම්පත් අප විසින් කළමනාකරණය කරන අයුරු, සහ අපගේ ජයග්‍රහණයන්, අභියෝග සහ අනාගතය දැක්ම තක්සේරු කර ගැනීම සඳහා ද උපකාරී වේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2021-2023 සඳහා වන සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්ක එකොළහ (11) ක් කෙරෙහි අවධානය යොමු කර ජාතික ආරක්ෂාව අපගේ ජනතාව රැකබලා ගැනීම කණ්ඩායම් ක්‍රියාකාරීත්වය තුළින් සාර්ථකව ඉටුකරමින් සිටී. COVID-19 වසංගතය තිබිය දී වුව ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එහි මෙහෙවර අත්හැර නොමැත. COVID-19 සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධාන එන්නත් දත්ත සංඛ්‍යාංකරණය සඳහා නිලධාරීන්/ ගුවන් භටයින් යොදවා දිවයින පුරා මිලියන 12.95 කට වැඩි COVID-19 එන්නත්කරණය පිළිබඳ දත්ත ඇතුළත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට අප විසින් සහාය වීම සහ එමඟින්, එන්නත් වැඩසටහනේ ප්‍රගතිය තක්සේරු කිරීම තුළින් කාලෝචිත ලෙස වසංගත තත්ත්වය පාලනය කිරීම සිදු කිරීමට සහාය වී ඇත. එසේම, රටේ ජාතික ආරක්ෂාව සහ ජාතියේ සංවර්ධනයේ අභියෝගයට මුහුණ දීම සඳහා අවශ්‍ය උපාය මාර්ග, සම්පත් සහ මෙහෙයුම් සංකල්ප අපි ක්‍රියාත්මක කරමින් සිටිමු.

මධ්‍යම අප්‍රිකාවේ සහ දකුණු සුඩානයේ (සේවා පුද්ගලයින් 327) එක්සත් ජාතීන්ගේ හමුදා කණ්ඩායම් වෙත භට පිරිස් යෙදවීමට අප විසින් අඛණ්ඩව කටයුතු කර ඇති අතර එමඟින් රටට විදේශ මුදල් ගලා ඒම වැඩි කිරීමට ධනාත්මක ලෙස බලපා ඇත. මෙම දුෂ්කර කාලවලදී නොසැලී සිටීම ගැන මම ශ්‍රී ලංකා ගුවන් හමුදා ශ්‍රම බලකායේ සෑම සාමාජිකයෙකුටම ස්තුතිවන්ත වෙමි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සිය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ද කැපවී සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස දුර්වලතා කිහිපයක් හඳුනාගෙන වර්තමානය වන විට ඒවා විසඳා ගනිමින් සිටින අතර එම නිසා අපට වඩාත් හොඳ තත්ත්වයකට පැමිණීමට හැකි වේ. අපගේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට අප උත්සාහ කරන විට අපගේ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවලට මඟ පෙන්වීම සඳහා විගණන සොයාගැනීම් සහ නිර්දේශයන් අපට වැදගත් තොරතුරු අඛණ්ඩව සපයනු ලබයි. කළමනාකාරීත්වයේ සාකච්ඡාව, විශ්ලේෂණ අංශය සහ අනුකූලතා වාර්තාව අපගේ සමස්ත මූල්‍ය කාර්යසාධනය මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දුර්වලතා තක්සේරු කිරීම සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම ගෙනහැර දක්වයි.

සමස්ත මූල්‍ය කාර්යසාධනය පෙන්වන පරිච්ඡේදය මඟින් මෙම වසරේ විගණනයේ ප්‍රතිඵල විගණකාධිපති වාර්තාව මඟින් විස්තර කරනු ලබයි. අපගේ ඉලක්කය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් උපාය මාර්ගයට, උපාය මාර්ගය ප්‍රතිපත්තිවලට සහ ප්‍රතිපත්ති රටේ අවශ්‍යතාවට ගැළපීම සහතික කිරීම සඳහා වන ප්‍රධාන කාර්යය විගණන ප්‍රතිකර්ම ප්‍රයත්නය වේ. අපගේ වෘත්තීය පරිචයන් නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් යුධ සටන්කරුවන්ට වඩා හොඳින් සහයෝගය දැක්වීම සහ ඉහළ ප්‍රමුඛතා සඳහා කාලය, මුදල් සහ පිරිස් නිදහස් කිරීම මගින් බදු ගෙවන්නන් විසින් වෙහෙස වී උපයන ලද සම්පත්වල වඩාත් හොඳ ආරක්ෂකයින් බවට පත්වීමට අපට හැකිවනු ඇත. අපගේ දැක්ම සහ මෙහෙවර වෙත අප යොමු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන සහයෝගය සහ දායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව කෘතඥ වේ. අපගේ සම්පත් කාර්යක්ෂමව සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීම සඳහා අප කැපවී සිටින අතර ශක්තිමත් මූල්‍ය විනිවිදභාවය සහ කාර්ය සාධනය සඳහා ලබා ඇති විශිෂ්ඨ ප්‍රගතිය මෙම වාර්තාව මගින් අවධාරනය කරනු ලබන අතර වඩාත් හොඳින් කටයුතු කිරීම සඳහා මෙම වාර්තාව අපට සහාය වන බව අපගේ විශ්වාසය වේ.



**එයාර් මාර්ෂල් එස්. කේ. පතිරණ**

WWV and Bar, RWP and Bar, RSP and three Bars, VSV, USP, MSc (MOA) USA, MSc (Def Stu) in Mgt, M Phil (Ind), MIM (SL), ndc (Ind), psc, qfi

**ගුවන් හමුදාධිපති**

2022 මැයි මස 13 වන දින

# 1. විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

අ. 2021 මූල්‍ය වර්ෂයේදී, ජාතික ආරක්ෂාව සඳහා ගුවන් බලය ඵලදායී ලෙස මෙහෙයවීමේ තම මූලික කාර්යභාරයට අතිරේකව 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, මෙන්ම ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වෙමින් ජාතික ආරක්ෂාව ට ඉහළ ප්‍රමුඛත්වයක් දෙමින්, වාර්ෂිකව රට තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය ලබා දී ඇත. විශේෂයෙන්ම, COVID-19 ට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සේවා සාමාජිකයින් සහ ඔවුන්ගේ යැපෙන්නන් සහ සිවිල් වැසියන් ඇතුළු අපගේ හමුදාවන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය දී ඇති අතර 2021 දී මෙම වෛරසයට එරෙහිව සටන් කිරීමට රජය ගන්නා සමස්ත උත්සාහයට සහාය දෙමින් සිටී. COVID-19 වසංගතය වැනි සංකීර්ණ අභියෝග හමුවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2021 මුදල් වර්ෂයේදී වැදගත් පියවරයන් දියත් කළ අතර එය ඉදිරි වර්ෂවලදී රජයේ මානව ප්‍රාග්ධන කළමනාකරණ භූ දර්ශනයට ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

ආ. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා අවශ්‍ය යැයි හඳුනාගත් අභ්‍යන්තර ගුවන් ගමන් කටයුතු වැඩිදියුණු කිරීමෙහිලා මූලිකත්වය ගෙන ක්‍රියාකොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතික ආපදා හා ව්‍යසනකාරී තත්ත්ව වලදී තුවාලකරුවන් මුදවා ගැනීම මෙන්ම අවස්ථානුකූලව භට පිරිස් යෙදවීම ආදිය මඟින් තම ක්‍රියාකාරී දායකත්වය ලබා දී ඇත. 2021 වාර්ෂික කාර්ය සාධන වාර්තාව තුළ 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, මෙන්ම ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" සහ ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් සමඟ විශ්ලේෂණය කිරීමට අදාළ තොරතුරු හා දත්ත ඇතුළත්ය. තවද, 2021 වර්ෂය තුළ ඉටු කිරීමට ස්ථාපිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය එහි තත්‍ය කාර්යසාධනයට සාපේක්ෂව විශ්ලේෂණය කිරීම හා 2021 වර්ෂයේ අපේක්ෂිත සැලැස්ම සඳහා ඉස්මතු කිරීම සිදු කර ඇත.

### ඇ. වාර්ෂික අයවැය වාර්තාව සමඟ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විශ්ලේෂණය කිරීම

(1) වාර්ෂික කාර්යසාධන වාර්තාව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ වාර්ෂික අයවැය වාර්තාවට සමාන පදනමක් මත සකස් කර ඇති අතර එමඟින් 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත ඉලක්ක වලට සාපේක්ෂව කාර්යසාධනය වාර්තා කරයි. සෑම අංශයකම කාර්ය සාධනය පිළිබඳ කෙටි සාරාංශයක් හා ඇගයීමක් අන්තර්ගත වන අතර ඊට අතිරේකව වර්ෂය තුළ සිදු කරන ලද ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ ඇතැම් කරුණු පසුබිම්කොටගත් කරුණු දැක්වීම් ඇතුළත්ය.

(2) වාර්ෂික අයවැය වාර්තාව, නැඟී එන ඉහළ පෙළේ ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තුව සංවිධානය වීමේදී විය හැකි වෙනස්වීම් පිළිබිඹු කරමින් කාලයත් සමඟ විකසනය වීමට ඕනෑකමින් සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ව්‍යුහය ස්ථාවරව පැවතියද, ඉහළ මට්ටමේ සහයක අරමුණු වලදී හා එම අරමුණු එකිනෙකට යා කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී එක් වාර්ෂික අයවැය වාර්තාවකින් ඊළඟ අයවැය වාර්තාවට සැලකිය යුතු ප්‍රමාණයේ වෙනස්කම් මතු වීම නොවැළැක්විය හැකි කරුණකි.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉහළ මට්ටමේ අරමුණු 2021-2023. සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇත. ඒ අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇති ඉලක්ක හා 2021 වර්ෂයේ  ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව 2021 දෙසැම්බර් 31 දිනට වන කාර්ය සාධනය පිළිබඳ සාරාංශයකින් ආරම්භ වේ. වියදම් සමාලෝචනයන්, වාර්තාව පුරාවටම දක්වා ඇත.

### ඈ. දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන 2021

(1) එක් එක් මූල්‍ය වර්ෂ වලදී අවශ්‍ය වූ, රඳවා තබාගත් හා බැහැර කළ සම්පත් හා වර්ෂය තුළ දී ඒවා භාවිත කළ ආකාරය විස්තර කරමින් මූල්‍ය වාර්තා සකස් කිරීමට දෙපාර්තමේන්තු වෙත නියම කරනු ලබයි. ඒ අනුව මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත සකස් කරනු ලබයි

(2) ඔවුන් විසින් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යයන්වල තත්ත්වය, ශුද්ධ සම්පත් නිපැයුම,අරමුණු සාක්ෂාත් කරගැනීමට යොදාගත් සම්පත්, හඳුනාගත් ලාභ හා අලාභ සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ නිවැරදි හා සාධාරණ මතයක් ලබා දිය යුතුය. 2021 වර්ෂය සඳහා වන දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනය මෙම වාර්තාව සමඟ අමුණා ඇත.

### ඉ. කාර්යසාධන කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව

(1) කාර්යසාධන කළමනාකරණය යනු උපායමාර්ගික අරමුණු හා ප්‍රමුඛතාවයන් නියම කිරීම, එහිලා වැඩසටහන් නිර්මාණය කිරීම, එම වැඩසටහන්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා දත්ත රැස්කිරීම හා ප්‍රගතිය මැන බැලීම, වැඩසටහන් හා සම්පත් විභජනය කෙරෙහි බලපෑ හැකි පරිදි කාර්යසාධන හා ඇගයුම් තොරතුරු උපයෝගී කරගැනීම, ආයෝජකයින් වෙත ප්‍රතිඵල සන්නිවේදනය හා තීරණ ගැනීම ආදී බහු අදියරයන්ගෙන් යුත් ක්‍රියාවලියකි.

(2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන කළමනාකරණය, 2021-2023 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම හා 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා 5 අවුරුදු සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙහෙයවා ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර හා මූඛ්‍ය හැකියාවන්

### අ. දැක්ම

"ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම"

### ආ. මෙහෙවර

"ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනූන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම"

ඇ. මුඛ්‍ය හැකියාවන්

ආයතනික මුඛ්‍ය හැකියාවන් එහි ඉලක්කගත අරමුණු ළඟා කරගැනීම සඳහා ආයතනය මෙහෙයවන ප්‍රධාන නිර්ණායකයන් වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුවද එවැනි අද්විතීය වූ මුඛ්‍ය හැකියාවන් පවතින අතර ඒවා පහත පරිදිය.

(1) ගුවන් මෙහෙයුම් හා ගුවන් ආරක්ෂක හැකියාව. ශ්‍රී ලංකාව තුළ ගුවන් මෙහෙයුම් කිරීම් සහ ගුවන් ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව වේ.

(2) සීමිත සම්පත් නවෝත්පාදාත්මක ලෙස උපයෝජනය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතීතයේ සිට විවිධ වූ තත්ත්වයන් යටතේ සීමිත සම්පත් උපයෝජනය කිරීම හා යෙදවීම තුළින් උපරිම ප්‍රතිඵල ලඟා කරගැනීමේ අද්විතීය හැකියාවක් පෙන්නුම් කර ඇත.

(3) අනේකවිධ මෙහෙයුම් අත්දැකීම් වලින් සන්නද්ධ වූ වෘත්තිමය, අභිප්‍රේරිත ශ්‍රම බලකායක් බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ පොහොසත් සම්ප්‍රදායන්ට උරුමකම් කියන, වෘත්තිමය සංවර්ධන ව්‍යුහයක් හා සුවිශේෂී පුහුණුවක් සහිත ආරම්භයේ සිටම විවිධ මෙහෙයුම් කාර්යයන් සඳහා ගුවන් බලය ලබා දීමෙන් ලද අත්දැකීම් සම්භාරයක්ද කැටිකර ගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සේවය වෙනුවෙන් කැප වූ අභිප්‍රේරිත සහ අනුවර්තිත හැකියාවෙන් ඉහළ වෘත්තිමය බලකායක් බිහි කර ඇත.

(4) ජාතික ආරක්ෂාව සඳහා සයිබර් අවකාශය හා විද්‍යුත් චුම්බක වර්ණාවලිය සඵලදයිව, ආරක්ෂාකාරීව හා වගකීමෙන් යුක්තව උපයෝජනය කිරීම.

(5) දීපව්‍යාප්ත විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ රේඩාර් ජාලයේ හිමිකාරිත්වය හරහා සන්නිවේදන හා ගුවන් නිරීක්ෂණ සඳහා විද්‍යුත් චුම්භක වර්ණාවලියත්, තොරතුරු කළමනාකරණය සඳහා සයිබර් අවකාශයත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ගුවන් හමුදාව සතුව අද්විතීය හැකියාවක් ඇත.

## 1.3 ප්‍රධාන කාර්යයන්

අ. යුධ හා නාවික හමුදාවන්ට උපායශීලි ගුවන් ආධාර සහ ප්‍රවාහන පහසුකම් සැලසීම.

ආ. රජයේ ඉල්ලීම මත මුදවා ගැනීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් සැලසීම.

ඇ. ගුවන්යානා, මාර්ග ප්‍රවාහන, විද්‍යුත් උපකරණ, වෙනත් පිරියත සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සඳහා ඉංජිනේරු හා සැපයුම් සේවා සම්පාදනය කිරීම.

ඈ. අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම් සඳහා හට පිරිස් සැපයීම.

ඉ යුධමය නොවූ ගුවන් මෙහෙයුම්වල නිරත වීම සහ ජාතික සංවර්ධනය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම.

ඊ. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා හට පිරිස්, ගුවන්යානා හා වාහන ලබා දීම තුළින් සක්‍රියව දායක වීම.

## 1.4 සංවිධාන සටහන


COMMANDER
Air Secretary
Chief of Staff
Deputy Chief of Staff
Director Air Operations
Director Ground Operations
Director Aeronautical Engineering
Director General Engineering
Director Electronics & Telecommunication Engineering
Director Logistics
Director Administration
Director Civil Engineering
Director Health Services
Director Training
Director Welfare
Deputy Director Ground Operations
Deputy Director Aeronautical Engineering
Deputy Director General Engineering
Deputy Director Electronics & Tele. Engineering
Deputy Director Logistics
Deputy Director Administration
Southern Air Commander
Northern Air Commander
Eastern Air Commander
Commanding Officer Volunteer Air Force
Commanding Officer Women's Wing
Director Air Intelligence
Director Budget
Director Information Technology
Director Legal
Director Media
Director Provost
Director Performing Arts
Director Sports
Director Civil Administration
Director Finance
Command Agro Officer
Command Audit Officer
Command Development Project Officer
Command Flight Safety Officer
Command Instrument Rating Examiner (Fixed Wing)
Command Instrument Rating Examiner (Rotor Wing)
Command Internal Auditor (Service)
Command Publication Officer
Command Quality Assurance Officer
Command Recruiting Officer
Command Research and Development Officer
Command Welfare Project Officer

## 1.5 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ විධායක අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන්.

### අ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් මෙහෙයුම් කාර්යයන් ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත් වේ. ගුවන් මෙහෙයුම්, ගුවන් ආරක්ෂාව, ගුවන් ගමන් පාලනය හා ගිනි නිවීම් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය වගකීම දරයි.

(ආ) ගුවන්යානා රක්ෂණය, ගිනි නිවීම්, ගුවන් ගමන් පාලනය හා ගුවන්යානා ධාවනපථවල ආරක්ෂාව යන ප්‍රධාන ශීර්ෂ යටතේ වන ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය ලං.රු.මි 52.20 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂා කළ ක්‍රියාකාරකම් බොහෝමයක් අධ්‍යක්ෂකය විසින් 2021 වර්ෂය තුළ සම්පූර්ණ කර ඇත.

### ආ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම 2014 පෙබරවාරි 28 වන දින ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය නැවත සේවයේ පිහිටුවන ලදී. ඕනෑම අයුරක බාහිර/අභ්‍යන්තර සතුරු ප්‍රහාර වැළැක්වීම සහ ගුවන් මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් වත්කම් හා ස්ථාපිතයන් ආරක්ෂා කිරීම අරමුණු කොට ගෙන පක්ෂාංග 29කින් යුත් ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තුව, ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය යටතේ පිහිටුවන ලදී.

(2) තත්‍ය කාර්ය සාධනය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීම

ආරක්ෂක උපකරණ, ආරක්ෂක අමුද්‍රව්‍ය, බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ උපකරණ, පැරෂුට් උපකරණ, රෙජිමේන්තු විශේෂ බලකාය සඳහා අවශ්‍ය උපකරණ සහ ගුවන් සුනඛයින් සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම ආදී ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි 2021 වර්ෂයේ ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය ලං.රු.මි 72.08 කි.

### ඇ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් යානාවන් ගුවන් ගමන් වලට යොදා ගත හැකි මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා සම්මත ඉංජිනේරු ප්‍රයෝගයන් භාවිතයට ගැනීම හා එමඟින් ගුවන් ගමන්වල ආරක්ෂාව තහවුරු කිරීමට ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය වගකියනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව වර්ග 27 ක ගුවන් යානා 106 ක් ඇත. මෙම ගුවන් යානා 106, පියාපත් සහිත ගුවන් යානා 60ක් හා හෙලිකොප්ටර් යානා 46 ක් ලෙස නැවත වර්ග කර දැක්විය හැක.

(ආ) ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය ලං.රු.මි 7,408.48 ක් වන අතර එය අයවැයෙහි විශාලතම කොටස වේ. අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය මඟින් ගුවන්යානා එන්ජින්, ගියර පෙට්ටි,අවරපෙති හා උපාංග මිලදී ගැනීම, ගුවන් යානා මිලදී ගැනීම, AOF(චීනය) ස්ථාපිත කිරීම, ගුවන්යානා නඩත්තු කිරීම, ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම ආදී ක්‍රියාකාරකම් සිදු කිරීමට සැලසුම් කර ඇත.

## ඇ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය

### (1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් පරිපාලනය කිරීම සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූලික කාර්යය වන පියාසර කිරීම සඳහා අවශ්‍ය වන සහය සපයනු ලබයි. ප්‍රධාන අංශ 02ක් හා වෘත්තීන් 10ක් මෙම අධ්‍යක්ෂකයේ විෂයපථය යටතේ පාලනය වේ.

(ආ) සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය හා මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගය මෙම ප්‍රධාන අනුබණ්ඩ දෙක වේ. වෘත්තීන් 10 කට අයත් විශේෂඥ දැනුමැති ගුවන්භටයින් මෙම අධ්‍යක්ෂකය සතු නමුත් සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් හා ගුවන් යානා ඉංජිනේරු සම්බන්ධ කාර්යයන්වල මාරුවෙන් මාරුවට නියැලී සිටින කාර්මික ඉංජිනේරු ශාඛාවේ නිලධාරීන් විසින් මෙහි සේවය සපයයි.

(ඇ) 2021 වර්ෂය ආරම්භයේදී සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා ලං.රු.මි 1,235.00 ක මුදලක් සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ප්‍රක්ෂේපනය කොට තිබුණි. පවතින ද්‍රවශීලතාවය මත පදනම්ව අධ්‍යක්ෂකය මෙම වෙන් කිරීම් වලින් එහි අත්‍යවශ්‍ය කාර්යයන් 2021 වර්ෂය තුළ සිදුකරගෙන ගොස් ඇත.

## ඉ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය

### (1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඵලදායි ලෙස විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික පහසුකම් සැපයීම හා නඩත්තුව මෙන්ම එම කාර්යයන් පරිපාලනය සඳහා විද්‍යුත් හා විදුලි සංදේශ (E&TE) ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී.

(ආ) 2021 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වී ඇති විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකයේ මූලික අයවැය ලං.රු.මි 1,241.50 කි. ක්‍රියාකාරී සැලැස්ම මඟින් වර්ෂය සඳහා වූ ඉලක්කයන් සපුරා ගැනීමට අදාළව ප්‍රක්ෂේපණයන් සිදු කර ඇත. 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් පුරෝකථනය කළ බොහොමයක් ව්‍යාපෘති ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවීම හරහා අධ්‍යක්ෂකය ඉතා විශිෂ්ට ලෙස තම කාර්යසාධනය පෙන්නුම් කර ඇත. තවද, ආරම්භ කර ඇති ව්‍යාපෘති කිහිපයක් වර්ෂය අවසානය වන විට නිම කිරීමද අපේක්ෂිත අතර ව්‍යාපෘති සුළු ප්‍රමාණයක් වර්ෂය තුළ ආරම්භ කර නොමැත.

## ඊ. සැපයුම් අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම මෙහෙයුම්, පුහුණුවීම්, පරිපාලනමය කටයුතු හා සුභසාධන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය සැපයුම් සහය ලබා දීම සඳහා මෙම අධ්‍යක්ෂකය පිහිටුවා ඇත.

(ආ) 2021 වර්ෂය ආරම්භයේදී, අධ්‍යක්ෂකය විසින් එහි සැපයුම් ක්‍රියාකාරකම් සඳහා ලං.රු.මි 5,454.00 ක මුදලක් ප්‍රරෝකථනය කොට ඇත. එම මුළු අයවැයෙන්, 92.32% ක් ආහාර, ඉන්ධන, තෙල් හා ලිහිසි තෙල් මෙන්ම නිල ඇඳුම් සැපයීම සඳහා වියදම් දරා ඇත. අධ්‍යක්ෂකය විසින් ප්‍රරෝකථනය කල බොහොමයක් කාර්යයන් වර්ෂය තුළදී ඉටු කරගෙන ඇත.

## උ. පරිපාලන අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් මෙන්ම සාමාන්‍ය විනය සම්බන්ධ රාජකාරි, නිලධාරීන් සම්බන්ධ කාර්යයන්, ගුවන්භට/කාන්තාභට ගුවන් සම්බන්ධ කාර්යයන්, වැටුප් හා දීමනා, ආයතනික කාර්යයන් හා අනෙකුත් පරිපාලනමය කරුණු යනාදිය මෙම අධ්‍යක්ෂකය වෙත පවරා ඇත.

(ආ) 2021 වර්ෂය සඳහා පරිපාලන අධ්‍යක්ෂකයේ මුළු අයවැය වෙන් කිරීම ලං.රු.මි. 31,668.20 ක් වන අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මුළු අයවැයෙන් 96.70% ක ප්‍රතිශතයක් වැටුප්, වේතන හා දීමනා ගෙවීම සඳහා වෙන් කර ඇත. අධ්‍යක්ෂකය විසින් ලං.රු.මි 865.00 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මුලික කඳවුරු හා කඳවුරුවල විදුලි හා ජල බිල්පත් ගෙවීම සඳහා වෙන් කර ඇති අතර එය මුළු අයවැය ප්‍රතිපාදනයෙන් 2.73% කි. ඉතිරි 0.56% ක මුදල ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම, ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම, ගමන් වියදම්, තැපැල් ගාස්තු, දේපල ණය පොලි ආදිය වේ.

## ඌ. සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) ප්‍රතිපත්ති සකස් කිරීම සහ විද්‍යුත්, කාර්මික හා සිවිල් යන විවිධ ඉංජිනේරු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සියලුම ඉංජිනේරු කාර්යයන් සිදු කිරීම සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත්වන සියලුම ඉංජිනේරු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අනුමත මිනිස් බලය, අනෙකුත් අමුද්‍රව්‍ය හා වෙන් කළ මුදල් ඵලදායී ලෙස යොදාගැනීම අධ්‍යක්ෂකය සතු කාර්යභාරය වේ.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය, ඔවුන්ගේ ප්‍රධානතම ශීර්ෂයන් වන සිවිල්, කාර්මික හා විද්‍යුත් ඉංජිනේරු කාර්යයන් සඳහා ලං. රු.මි 853.00 ක මුදලක් පුරෝකථනය කර ඇත. කාර්මික හා විද්‍යුත් භාණ්ඩ මිලදී ගැනීම, වාහන අලුත්වැඩියාව හා නඩත්තුව, සිවිල් ඉංජිනේරු යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම, සියලු ශ්‍රීලංගුහ ස්ථාපිතයන්ගේ වැඩිදියුණු කිරීම් හා එකතු කිරීම් සිදු කිරීම, ගුවන් ධාවනපථ ප්‍රතිසංස්කරණය කිරීම, යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම, සිවිල් ඉංජිනේරු වැඩපළ උපකරණ මිලදී ගැනීම, සිවිල් ඉංජිනේරු යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම, පොම්ප, වායු සමීකරණ යන්ත්‍ර හා ජෙනරේටර් මිලදී ගැනීම සහ ගොඩනැඟිලි හා ආකෘති ඉදි කිරීම ආදිය මෙයට ඇතුලත්ය. 2021 වර්ෂය අවසානයේදී අධ්‍යක්ෂකය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කෙරුණු බොහොමයක් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවා ඇති අතර ඇතැම් ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර තවමත් අවසන් කර නොමැත. විවිධ හේතූන් මත ඇතැම් ක්‍රියාකාරකම් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොමැත.

## එ. පුහුණු අධ්‍යක්ෂකය

### (1) හැඳින්වීම

(අ) පුහුණු ප්‍රතිපත්ති සැකසීම,ආරම්භක,මූලික හා උසස් වෘත්තීය පුහුණු, විශේෂඥ හා උපදේශක පුහුණු, ගුවන්භටයින්ගේ හා නිලධාරීන්ගේ උසස්වීම් සඳහා වන විභාග සැලසුම් කිරීම හා පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පුහුණු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙම අධ්‍යක්ෂකය මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සියලුම පුහුණු මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතීන් සාක්ෂාත් කර ගනිමින් පවත්වාගෙන යන බව තහවුරු කරනු ලබයි.

(ආ) පුහුණු අධ්‍යක්ෂකය විසින් ඉතා උසස් තත්ත්වයේ සේවාවක් සැපයීමේ අරමුණින් ශ්‍රීලංගුහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ශක්‍යතා ගොඩ නැංවීම හා පුහුණු අවශ්‍යතා සඳහා 2021 වර්ෂයේදී ලං.රු.මි 647.06 ක මුදලක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් පුරෝකථනය කර ඇත.

(ඇ) ගුවන් නියමුවන්, ගුවන්යානා ඉංජිනේරුවරුන්, සිවිල් වෛද්‍යවරුන්, ගණකාධිකාරීවරුන්, විගණන නිලධාරීන්, රෙජිමේන්තු නිලධාරීන්, යන විවිධ වෘත්තිකයින් සඳහා තම ශක්‍යතා වර්ධනය කර ගැනීම හා කුසලතා ඉහළ නංවා ගැනීම සඳහා 2021 වර්ෂය තුළදී ශ්‍රීලංගුහ විසින් දේශීය මෙන්ම විදේශීය පුහුණු පාඨමාලාවන් පවත්වා ඇත. රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය විශිෂ්ට කාර්යසාධනයක් සහිත කුසලතා පූර්ණ හමුදා සේවයක් බිහි කිරීම පුහුණු අධ්‍යක්ෂකය සතු මූඛ්‍ය අරමුණ වේ. ඒ අනුව 2021 වර්ෂයේදී නිම කිරීමට අරමුණු කරගත් බොහෝ ව්‍යාපෘති, අධ්‍යක්ෂකය විසින් සාර්ථකව වර්ෂය තුළ නිම කර ඇත.

## ඒ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම

(අ) තාක්ෂණික වශයෙන් බලවත් හමුදාවක ප්‍රධාන හේතුකාරකයක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය රැකගැනීමේ කාර්යයෙහිලා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂකයෙහි ප්‍රමුඛ කාර්යය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අමතරව ගුවන් හමුදා රෝහල්වල රෝගීන්ට සත්කාර කිරීමේ කටයුතු හැසිරවීමට අවශ්‍ය ශක්‍යතාවන් සංවර්ධනය කළ යුතුව ඇත.

(ආ) 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, අධ්‍යක්ෂකයේ මුළු අයවැය ලං.රු.මි 242.20ක් වන අතර එය 2021 වර්ෂයේ අයවැය වෙන් කිරීම් මඟින් වියදම් දැරීමට අපේක්ෂිතය.

## ඔ. සුභසාධක අධ්‍යක්ෂකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම නිලධාරීන්/ගුවන්භටයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය ගුවන් හමුදාධිපතිට වග කියනු ලැබේ. ඒ අනුව සේවා පුද්ගලයින්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට මූල්‍ය හා වෙනත් අත්‍යවශ්‍ය සුභසාධන පහසුකම් සැපයීම සඳහා සුභසාධන කටයුතු ආරම්භ කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය වගකීම සහිතව මෙම අධ්‍යක්ෂකය කටයුතු කරනු ලැබේ. එමෙන්ම ක්‍රියාකාරී සේවයේදී ආබාධිත වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් පුනරුත්තාපනය හා ඔවුන්ට අවශ්‍ය සුභසාධන කටයුතු සැලසීම සුභසාධන අධ්‍යක්ෂකයෙහි වගකීම වේ.

## ඕ. විනයාරක්ෂක අධ්‍යක්ෂකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදා පොලිසිය, ගුවන් හමුදාව තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහ ඉහළ විනයක් පවත්වා ගෙන යාමට මුලිකවම වගකියනු ලැබේ. විශේෂ පුද්ගලයින් සඳහා යතුරුපැදි වලින් ගමන්ගන්නා පරිවාර ආරක්ෂකයින් ලබා දීම, ගුවන් හමුදා උත්තමාචාර පෙළපාලි, පිරිස් පාලනය හා රථවාහන පාලනය ආදී සම්මානනීය අවස්ථා රාජකාරීන් සිදු කිරීම, පොලිස් නිලධාරියකු විසින් සිදු කරනු ලබන ප්‍රධාන රාජකාරීන්ගෙන් කිහිපයකි.

## ඖ. ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම බුද්ධි තොරතුරු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2017 මැයි 23 දින ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විෂය පථයට ගැනෙන ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය සහ ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්, ගොඩබිම් බුද්ධිය, ගෝලීය බුද්ධිය සහ සයිබර් බුද්ධිය ඇතුළු ගුවන් බුද්ධිය කාර්යක්ෂමව හා ඵලදායිව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂකය වගකියනු ලැබේ.

### ක. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය

<u>හැඳින්වීම</u> ශ්‍රීලංකා ගුවන් හමුදාව තුළ පිහිටි ස්වාධීන අධ්‍යක්ෂකයක් ලෙස තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය පිහිටුවා ඇත. ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති, තොරතුරු ජාලයන්, දෘඩාංග, දත්ත පද්ධති, බහුමාධ්‍ය සැලසුම් සහ සයිබර් ආරක්ෂාව ඇතුළු සියලුම තොරතුරු තාක්ෂණ පද්ධති හා මෙවලම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂකයේ ප්‍රධාන කාර්යය වේ.

### ඛ. මුදල් අධ්‍යක්ෂකය

<u>හැඳින්වීම</u> මුදල් අධ්‍යක්ෂකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ක්‍රියාකාරකම් රාජ්‍ය භාණ්ඩාගාරය හා සම්බන්ධ වෙමින් කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. අයවැය ගත සියලු වියදම් සඳහා පවතින ද්‍රවශීලතාවය තහවුරු කර ගැනීම හා අදාළ වියදම් සිදු කරන ආකාරය පිලිබඳ උපදෙස් ලබා දීම මෙම අධ්‍යක්ෂකය මඟින් සිදු කරනු ලබයි.

### ග. සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය

<u>හැඳින්වීම</u> විවිධ අධ්‍යක්ෂකයන් යටතට ගැනෙන විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සිවිල් සේවකයින් ලබා දීම සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය විසින් සිදු කරනු ලබයි. කාර්යක්ෂම පරිපාලනයක් සඳහා සහ සිවිල් සේවකයින්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද මෙම අධ්‍යක්ෂකය ගුවන් හමුදාධිපතිට වගකියනු ලබයි.

### ඝ. අයවැය අධ්‍යක්ෂකය

<u>හැඳින්වීම</u> ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්වාධීන අධ්‍යක්ෂකයක් ලෙස අයවැය අධ්‍යක්ෂකය පිහිටුවා ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් (ප්‍රතිපාදන) ලබා ගැනීම සහ රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය වර්ෂයක් තුළ අදාළ අධ්‍යක්ෂකවරුන්/ විධායක නිලධාරීන් වෙත වෙන් කළ ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය උදෙසා ඔවුන් හට සැලකිය යුතු මට්ටමේ පෙළඹවීමක් සිදු කිරීම, අයවැය අධ්‍යක්ෂකයේ මූලික කාර්යය වේ.

## ණ. ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය

හැඳින්වීම ජාතික වශයෙන් සහ සංවිධානයක් වශයෙන් උත්සව සහ විනෝදාස්වාදය සැපයීමේ අවශ්‍යතාව, සපුරාලීම මෙන්ම ශ්‍රී ලංගුහ සේවයේ නියුක්ත සහ විශ්‍රාමික පුද්ගලයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ සුභසාධනය සඳහා විනෝදාස්වාදය සැපයීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඇති එකම ආයතනය ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය වේ. රට තුළ ඇති කීර්තිමත් ප්‍රසාංගික ආයතනයක් ලෙස ස්ථාපිත ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය සංවිධානයේ ප්‍රධාන ආදායම් උත්පාදක අංශය ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදායම ශක්තිමත් කරයි.

## ත. මාධ්‍ය අධ්‍යක්ෂකය

හැඳින්වීම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාවේ මහජනයා වෙත වගකිව යුතු හා පිළිතුරු සැපයිය යුතුය. කෙසේ නමුත්, දෛනික රාජකරින්ට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම ආයතනික ප්‍රතිරූපය ගොඩනැංවීම හා ආරක්ෂා කර ගැනීම සලකා හෝ ආයතනයට පරිභාහිරව ගොඩනැඟෙන සංවාදයන්ට ප්‍රතිචාර දැක්වීම සලකා, සාමාන්‍ය ජනතාව සමඟ ඍජුව සම්බන්ධ වීම අත්‍යවශ්‍ය වනු ඇත. එය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ සාමාන්‍ය ජනතාව අතර සිදුවන ඕනෑම හා සියලුම ආකාරයේ සන්නිවේදනයන් ජාතික ආරක්ෂාවට ඇති බලපෑම පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගරුත්වය හා සදාචාරය ආරක්ෂා වන පරිදි සිදු කළ යුතු අතර එවැනි සියලුම ආකාරයේ සන්නිවේදනයන්ගේ අන්තර්ගතය හා හඬ හැසිරවීම, ශ්‍රී ලංකා ගුවන් හමුදාධිපතිගේ ඍජු විෂය පථයට ගැනෙන අධිකාරියක් විසින් පරීක්ෂාවට ලක් කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතුය.

## ද. දන්ත වෛද්‍ය සේවා කාර්යාලය

(1) හැඳින්වීම

(අ) රෝග වැළැක්වීමේ හා සුව කිරීමේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවක් ලෙස දන්ත වෛද්‍ය සේවය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් හා ව්‍යක්තිමය අයුරින් ලගාකරගත හැකි විය යුතුය. දන්ත වෛද්‍ය සේවා කාර්යාලය තම සේවාවන් සියලුම ශ්‍රීලංගුහ ආයතන වෙත ව්‍යාප්ත කරන අතරම දන්ත වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය නිරතුරුවම වැඩි දියුණු කිරීමට ක්‍රියාකරමින් සිටියි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දන්ත වෛද්‍ය සේවා කාර්යාලය සඳහා වෙන් කල මුළු අයවැය ප්‍රමාණය ලං.රු.මි 44.50 ක් වන අතර එය 2021 වර්ෂයේ අයවැය වෙන් කිරීම් මඟින් වියදම් දැරීමට අපේක්ෂිතය.

## න. විධායක බඳවා ගැනීමේ කාර්යාලය

හැඳින්වීම බඳවා ගැනීම් සිදු කිරීම විධායක බඳවා ගැනීමේ නිලධාරියාගේ වගකීම වේ. බඳවා ගැනීමේ අංශයෙහි කාර්යභාරය වනුයේ ගුවන් හමුදාධිපතිවරයාගේ අණ පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා නිත්‍ය/ස්වේච්ඡා සේවයන්ගේ නිලධාරී, කාන්තා නිලධාරී, ගුවන් භට සහ ගුවන් කාන්තා යන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමයි. ගැසට් නිවේදන, පුවත්පත්/රූපවාහිනී දැන්වීම් සහ විශේෂ බඳවා ගැනීමේ ප්‍රවාහයන් හරහා මෙම අරමුණ ඉටු කරගනු ලැබේ.

## ප. විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශය (CFSI)

(1) හැඳින්වීම

(අ) විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ (CFSI) ප්‍රධානියා ලෙස කටයුතු කරන විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරියා (CFSO) විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ආරක්ෂණ සංවිධානයේද මුලසුන හොබවන අතර එම විෂය පථය යටතට ගැනෙන සියලුම කාර්යයන් සඳහා ඔහු ගුවන් හමුදාධිපතිට වගකියනු ලබයි. ගුවන් ආරක්ෂණය සඳහා වන පියාසර හා ඉංජිනේරු කටයුතු හැසිරවීම් සඳහා වෙන් වෙන්ව මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සිටී.

(ආ) පියාසර කිරීම්, ඉංජිනේරු හා වෛද්‍ය යන අංශ නියෝජනය කරන පරිදි ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු සිටින අතර ඔවුන් ප්‍රතිපත්ති, ක්‍රියාපිළිවෙත් සකස් කිරීම හා විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ සමාලෝචන හා වෙනත් කාර්යයන් ඉටු කිරීම සඳහා විධායක ගුවන් නිරීක්ෂණ පරීක්ෂණ නිලධාරියා සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරයි. තවද, Fixed Wing, Rotor Wing, Jet Aircraft සහ ගුවන් ගමන් පාලනය යන අංශ නියෝජනය කරමින් ගුවන් ආරක්ෂණ පරීක්ෂකවරු සිව් දෙනෙකු සිටින අතර ඔවුන් ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂකවරයා යටතේ කටයුතු කරයි.

## බ. විධායක තත්ත්ව නිර්ණ නිරීක්ෂණ ඒකකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ තත්ත්ව නිර්ණ නිරීක්ෂණය පිළිබඳ කාර්යයන් ඉටු කිරීම සඳහා විධායක තත්ත්ව නිරීක්ෂණ ඒකකය(CQAI) ස්ථාපිත කර ඇත. මෙම ඒකකයේ ප්‍රධානියා ලෙස විධායක තත්ත්ව නිර්ණ නිරීක්ෂණ නිලධාරියා (CQAO) කටයුතු කරයි. ඔහු තත්ත්ව නිරීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් ඒකකයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සෘජුවම ගුවන්හමුදාධිපතිට වග කියනු ලබයි.

## ම. විධායක නීති දෙපාර්තමේන්තුව

හැඳින්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නීතියේ ආධිපත්‍යය පිළිගන්නා, කවර හෝ බලපෑමකට යටත් වීමකින් තොරව ස්වාධීනව හා විනිවිද භාවයෙන් යුක්තව, කාර්යක්ෂම, ඵලදායී සහ නිරවද්‍ය නීති උපදෙස් හෝ වෙනත් ඕනෑම නීති සේවාවන් ශ්‍රීලංගුහ ට සැපයීමේ පරමාර්ථයෙන් යුක්තව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධායක ව්‍යුහයේ ස්වාධීන අංගයක් ලෙස ශ්‍රීලංගුහවේ විධායක නීති දෙපාර්තමේන්තුව 2007 ජනවාරි 1 වන දින ස්ථාපිත කරන ලදී.

## ය. අභ්‍යන්තර විගණන අංශය

හැඳින්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මගින් දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය 2011 වර්ෂයේදී ස්ථාපිත කරන ලදි.ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය ගුවන් හමුදාධිපතිට සෘජුව වගකියන අංශයක් වන අතර "විධායක අභ්‍යන්තර විගණක" යටතේ පාලනය වේ. රජයේ සිවිල් නිලධාරියෙකු ප්‍රධාන අභ්‍යන්තර විගණක(සිවිල්) ලෙස පත්කිරීමෙන් පසු 2017 දී මෙම පත්කිරීම "විධායක අභ්‍යන්තර විගණක (සේවා)" ලෙස නම් කරන ලදි. "ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්)" ද ස්වාධීනව අභ්‍යන්තර විගණන රාජකාරී ඉටුකරන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිට වාර්තා කරයි.

## ර. විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය

(1) හැඳින්වීම

(අ) 2011 මාර්තු මස සිට මේ දක්වා විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය ක්‍රියාත්මක වේ. ගුවන් හමුදාවේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා දක්වා විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය ස්ථාපිත කර ඇත.

(ආ) කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුරේ පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය (RDW) 2015 වර්ෂය තුළ ස්ථාපිත කරන ලද අතර එය විධායක පර්යේෂණ සහ සංවර්ධන නිලධාරී (CRDO) යටතේ ක්‍රියාත්මක වේ. පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ සිටින වෘත්තිකයින්, ආයතන හා විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධ වෙමින් ශ්‍රීලංගුහ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයීම පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය වෙත පැවරී ඇත.

## ල. විධායක සුභසාධන ව්‍යාපෘති ඒකකය

(1) හැඳින්වීම

(අ) සුභසාධන කටයුත්තක් ලෙස ගුවන් හමුදා සාමාජිකයින්ගේ පරිභෝජනය සඳහා සියලුම අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හා වෙනත් පාරිභෝජ්‍ය භාණ්ඩ සහනදායී මිලට සැපයීමේ අරමුණින් විධායක සුභසාධන ව්‍යාපෘති ඒකකය පිහිටුවන ලදී.

(ආ) විධායක සුභසාධන ව්‍යාපෘති ඒකකයේ මෙහෙයුම් කාර්යයන් ලෙස බාහිර ආයතනයන්ගෙන් පාරිභෝජ්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයෙන් ප්‍රසම්පාදනය කිරීම, එම භාණ්ඩ ගබඩා කිරීම හා දීපව්‍යාප්තව පිහිටි ශ්‍රීලංගුහ ආයතනයන් වෙත ඒවා බෙදා හැරීම ආදී සැලකිය යුතු මට්ටමේ ගණුදෙනු සිදු කරනු ලබයි.

## ව. විධායක සංවර්ධන ව්‍යාපෘති ඒකකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන කාර්යයන් වලට අවශ්‍ය ගල් වැලි සැපයීම සඳහා විධායක සංවර්ධන ව්‍යපෘති නිලධාරී (CDPO)යටතේ විධායක සංවර්ධන ව්‍යාපෘති ඒකකය(CDPU) පිහිටුවා ඇත. විධායක සංවර්ධන ව්‍යාපෘති නිලධාරී (CDPO) ඍජුවම ගුවන් හමුදාධිපතිට වාර්තා කරයි. ඉදිකිරීම් සඳහා අවශ්‍ය කළුගල් ඉල්ලුම සපුරා ගැනීම සඳහා තෝරාගත් ප්‍රදේශවල ගල්වලවල් (quarry) ආරම්භ කිරීම සඳහා වන වගකීම ගුවන් හමුදාව වෙත පවරා ඇත. සංවර්ධන කටයුතු වලට අමතරව, යුධමය ඉදිකිරීම් සඳහා ත්‍රිවිධ හමුදාව වෙත තම නිෂ්පාදන සැපයීමට ද මෙම ව්‍යාපෘතිය බැඳී සිටියි.

## ස. විධායක කෘෂි ඒකකය

හැඳින්වීම ශ්‍රී ලංකා ගුවන් හමුදා විධායක කෘෂි ඒකකය පිහිටුවා ඇත්තේ කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදනය හා වාණිජ ව්‍යාපාරවල උන්නතිය හා සම්බන්ධීකරණය සඳහා මෙන්ම ගුවන් හමුදාවේ සියලුම සේවා හා සිවිල් කාර්ය මණ්ඩලය වෙත තම ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහාය.

## හ. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්

(1) හැඳින්වීම 2014 හා 2015 යන වර්ෂවල පිළිවෙලින් මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් (MINUSCA) හා දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් (UNMISS) රාජකාරි සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් බලඇණි 02ක් යොදවන ලදී. කෙසේ වුව ද, දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් බලඇණිය (UNMISS) 2021 අගෝස්තු 07 දින සිට ආපසු කැඳවන ලද අතර මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් මේ දක්වා රාජකාරියෙහි යොදවා ඇත.

(2) විෂය පථය

(අ) බලඇණි ප්‍රවාහනය, ස්ථානගත කිරීම සහ ඉවත් කිරීම
(ආ) ගුවන් සංචාර (සන්නද්ධ බලඇණි සහිතව)
(ඇ) යුධමය සෝදිසි කිරීම් සහ ගලවා ගැනීම් (CSAR) (with AH support)
(ඈ) සෝදිසි කිරීම් සහ ගලවා ගැනීම් (SAR)
(ඉ) CASEVAC/MEDVAC (with AMET provided from mission)
(ඊ) ගුවන් ආවේක්ෂනය සහ සෝදිසි කිරීම්
(උ) නිරීක්ෂණය/නියාමනය/කාර්යයන්
(ඌ) මගී ප්‍රවාහනය
(එ) ප්‍රභූ ප්‍රවාහනය
(ඒ) මෙහෙයුම් ප්‍රවර්ථන සහය
(ඓ) තැපෑල සහ වැටුප් ලේඛන ප්‍රවාහනය
(ඔ) හදිසි ඉවත්කාරීම්/නැවත පිහිටුවීම්
(ඕ) ගුවන්විදුලි/ විදෘශ්‍ය (Video) ප්‍රචාරණය
(ඖ) ගුවනින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම (air drops)

# 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රගතිය

අ. ඉලක්කය 01 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවන් ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) රේඩාර් අමතර කොටස් සහ භූමියේ සිට ගුවන් සන්නිවේදන උපකරණ මිලදී ගැනීම.

(2) නව රේඩාර් අමතර කොටස් ලබා ගැනීම සහ ක්‍රියාත්මක නොවන රේඩාර් මොඩියුල අළුත්වැඩියා කිරීම.

(3) මීරිගම ADC සහ CC ශ්‍රීලංගුහ කඳවුර සහ කටුනායක මූලික කඳවුර ADC සහ CC ශ්‍රීලංගුහ පොරොත්තු කඳවුර වෙත AASL ගුවන් ගමනාගමන කළමනාකරණ (ATM) තොරතුරු ලබා ගැනීම සඳහා BIA වෙතින් ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතියක් (ATM) මිලදී ගැනීම.

(4) නව රෝහිණී රේඩාර් පද්ධති 2 ක් අත්පත් කරගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

(5) ගුවනින් බිජ ඉසීමේ ව්‍යාපෘතිය සඳහා කැබිලිත්ත ප්‍රදේශයේ දී 2021 ජන.14, 2021 ඔක්.05, 2021 ඔක්.06 සහ 2021 නොවැ. 23 දිනයන්හි MI-17 හෙලිකොප්ටර් යානයක් යෙදවීම මගින් පහසුකම් සැලසීම.

(6) අංක 03 බලඇණිය සඳහා B-200 ගුවන් යානා සඳහා GPS 175 පද්ධතිය වැඩි දියුණු කිරීම

(7) අංක 02 බලඇණියෙහි AN 32 B ගුවන් යානා සඳහා LYNX 9000D+ TCAS පද්ධතිය වැඩි දියුණු කිරීම.

(8) අංක 08 බලඇණියෙහි Y-12 II ගුවන් යානා සඳහා GTN 750 පද්ධතිය වැඩි දියුණු කිරීම.

(9) යුක්‍රේනයේ පැවති AN 32 ගුවන් යානා සහ පාරු ගුවන් යානා පුහුණුව සඳහා ශ්‍රී ලංගුහ සාමාජිකයින් 05 (තාක්ෂණික ශිල්පී 03, නිලධාරීන් 02) දෙනෙකු වාර 02 ක දී සහභාගී විය.

(10) ශ්‍රී ලංගුහ සාමාජිකයින් 08 (තාක්ෂණික ශිල්පී) දෙනෙකු වාර 02 ක දී පකිස්ථානයේ වෘත්තීය දෙනෙකු වාර 02 ක දී සහභාගී විය.

(11) බෙල් 412 හෙලිකොපටර් සඳහා වන GTN 625 GPS පද්ධතිය GTN 750 පද්ධතිය ලෙස වැඩි දියුණු කිරීම.

(12) වාර්තා වූ විශේෂ සිදුවීම් ගණන 21 වන අතර තාක්ෂණික දෝෂ 21 ක් සහ කුරුළු පහරදීම් 03 ක් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් ශක්‍යතාවය පවත්වා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

(13) පියාසර අංශය සඳහා AC/DC සෘජුකාරක (Rectifier) ඒකකයක් මිල දී ගැනීම.

(14) ශ්‍රී ලංගුහ භාවිතය සඳහා බෙල් 212 ජැක් 03ක් මිල දී ගැනීම.

(15) බෙල් 212/412 VIP/VVIP හෙලිකොප්ටර් සඳහා fire squib 09ක් මිල දී ගැනීම.

(16) ආයුධ සේවා තත්ත්වය ඉහළ නැංවීම සඳහා ලීටර් 1400 Aeroshell ද්‍රාවණ මිල දී ගැනීම.

(17) මි.මී.9 පතොරම් 3300 මිල දී ගැනීම.

(18) AN 32 B ගුවන් යානා 03 ක් පූර්ණ අළුත්වැඩියා කිරීම. (SCM-863, SCM-860 and SCM-869).

(19) Mi 17 හෙලිකොප්ටර් 02 (SMH-4417 සහ SMH-4418) පූර්ණ අළුත්වැඩියා කිරීම.

ආ. ඉලක්කය 02 අනන්‍ය ආර්ථික කලාපය ද ඇතුලුළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික හා උපායශීලී ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් වර්ධනය කිරීම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) නව රෝහිණී රේඩාර් පද්ධති 2 ක් අත්පත් කරගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

(2) ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ එක්ව නෞකාවක් මතට හෙලිකොප්ටර් යානයක් ගොඩ බැස්සවීමේ හා ගුවනින් භාණ්ඩ/පුද්ගලයින් ඔසවාගෙන යාමේ මෙහෙයුම්ද ඇතුළත්ව සෝදිසි හා මුදවාගැනීමේ අභ්‍යාස පැවැත්වීම 2021 පෙබරවාරි 08 සිට 10 දින දක්වා පැවති "කොළඹ නාවික අභ්‍යාසය" 2021 සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා සහභාගී කරවීම. තවද, 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ සමුද්‍රීය සෝදිසි හා මුදවාගැනීමේ ඒකාබද්ධ අභ්‍යාසයන් මාසිකව පැවැත්වීම සඳහා සැලසුම් කිරීම.

(3) සෙවුම්කරු MK II UAV පද්ධතියේ සේවය ආපසු ලබාගෙන එය සෙවුම්කරු MK III UAV පද්ධතියට වැඩිදියුණු කිරීමේ යෝජනාව ක්‍රියාත්මක වෙමින් පවතී.

(4) දේශීය UAV පද්ධතිය (ලිහිණියා UAV පද්ධතිය) සංවර්ධනය වෙමින් පවතී.

(5) ගුවන් හා සමුද්‍රීය යුධ උපාය සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (AMSCC) සමඟ ගුවන් ආරක්ෂණ (ADRADAR) හා ගුවන් ගමන් පාලන (ATCR) රේඩාර් තිර ඇතුළත් තත්කාලීන දත්ත හුවමාරු/සන්නිවේදන පද්ධතියක් පිහිටුවීම.

(6) කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුරෙහි R&D ව්‍යාපෘතිය සඳහා Airmax දත්ත සම්බන්ධීකරණ පද්ධතියක් මිල දී ගැනීම.

(7) Indra MK II රේඩාර් සඳහා අමතර කොටස් සහ උපාංග සහ විශේෂිත පරීක්ෂණ උපකරණ මිල දී ගැනීම.

ඇ. ඉලක්කය 03 ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු පිළිබඳ ඒකකය පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් හඳුන්වාදීම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) වී.අයි.පී. සහ වී.වී.අයි.පී. (VIP & VVIP) ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ඩ්‍රෝන් උපකරණවලින් සමන්විත ශ්‍රී ලංගුහ භූමිගත ගුවන් ආරක්ෂණ පද්ධතිය.

(2) අතේ ගෙන යා හැකි ඩ්‍රෝන් තුවක්කු සහ අතේ ගෙන යා හැකි ඩ්‍රෝන් ජෑමර් මිලදී ගැනීම. (භූමියේ ආරක්ෂාව ඉහළ නැංවීම සහ ශක්තිමත් කිරීම සඳහා පිටේ බැඳගෙන යා හැකි ඩ්‍රෝන් ජෑමර් බැටරි සහ අතේ ගෙන යා හැකි ඩ්‍රෝන් තුවක්කු බැටරි මිල දී ගන්නා ලදි.)

ඈ. ඉලක්කය 04 අත්‍යවශ්‍ය ගුවන් වත්කම්, ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් ආරක්ෂාවක් ලබාදීම සහ VAs සහ VPs සඳහා ආරක්ෂාව සැපයීම

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) ගිනි පාලන USFM රේඩාර් වෙනුවට GIBKA-S පද්ධතිය ආදේශ කිරීම සිදු කරමින් පවතී.

(2) අතිගරු ජනාධිපතිතුමාගේ භූමිගත ගුවන් ආරක්ෂක (LBAD) ආවරණය ශක්තිමත් කිරීම සඳහා කොළඹ සහ මිරිහාන හි නව ගුවන් ආරක්ෂණ ස්ථාන ස්ථාපිත කිරීම.

(3) භූමිගත ගුවන් ආරක්ෂණ පද්ධතිය සඳහා GIBKA-S ගිනි පාලන රේඩාර් පද්ධතිය සමඟ ඒකාබද්ධ IGLA-S මිසයිල පද්ධතිය අත්පත් කර ගැනීම සිදු කරමින් පවතී.

(4) දේශ සීමා ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ආවේක්ෂණ කැමරා (CCTV) සහ අදාළ වන උපකරණ ලබා ගැනීම.

ඉ. ඉලක්කය 05 දිවා / රාත්‍රී / සියලු කාලගුණික තත්ත්වයන් තුළ මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවනපථ වැඩිදියුණු කිරීම්.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) ICAO නියමයන් ප්‍රකාරව සියලුම ගගන යාත්‍රාංගන සලකුණු හා හෙලිකොප්ටර් ගොඩබෑමේ සලකුණු ප්‍රමිත කිරීම.

(2) පුළුල් ගිනි ආරක්ෂණ රැකවරණයක් ලබා දීමේ අරමුණින්, සියලුම සිවිල් ගුවන්යානා ක්‍රියාකරවන්නන් හට තමන්ගේ ගිනිගැනීම් වැළැක්වීමේ සම්මත මෙහෙයුම් ක්‍රියාවලින් (SOPs) පිළිබඳව, ගුවන්යානා ගොඩබෑමේ ස්ථානවල රාජකාරියේ යෙදී සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ භටයින් ව දැනුවත් කරන ලෙස සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) මඟින් දැනුම්දීමක් සිදු කර ඇත.

(3) වායුපීඩනමාන, සුළං වේග දර්ශක සහ ගගනයාත්‍රාංගන ප්‍රදීප වැනි ICAO සම්මත උපකරණ භාවිතයෙන් ගුවන්ගමන් පාලන (ATC) කුළුණු වැඩිදියුණු කිරීම.

(4) බොහෝ ප්‍රතිසම ගුවන් ගමන් පාලන උපකරණවල කියවීම් ප්‍රමිතිකරණය කිරීම සඳහා එම උපකරණ ඩිජිටල් අනුවාද වලට යාවත්කාලීන කිරීම.

(5) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියළු ගුවන් ක්ෂේත්‍රයන්හි ප්‍රමිතිය උසස් කිරීම සඳහා යෝජනාවක් සකස් කිරීම.

(6) මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන ආරක්ෂක ගැටළු අවම කර ගැනීමේ අරමුණින් විද්‍යාපීඨ, මූලික කඳවුරු/කඳවුරු/පියාසර බලඝනවල වාර්ෂික ගුවන් ආරක්ෂක සමීක්ෂණ 14ක් පැවැත්වීම. ගුවන්ධාවන පථ,ගුවන්යානා හැසිරවීමේ කලාපවල ආලෝක පහන් වෙනුවට යොදා ගත හැකි Goose Necks ආලෝක පහන් භාවිතය වැනි විකල්ප සැලසුම් පිළිබඳ සාකච්ඡා කිරීම.

(7) වැඩි දුරටත්, මෙහෙයුම් ශක්‍යතාවන් නිශ්චය කර ගැනීම සහ කළ යුතු වැඩි දියුණු කිරීම් හඳුනා ගැනීම සඳහා දිගන හෙලිපෑඩ් හි විශේෂ සමීක්ෂණයක් පැවැත්වීම.

(8) ගුවන් මෙහෙයුම් ආරම්භ කිරීමට ඇති යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා මන්නාරම ගුවන්පථයේ විශේෂ සමීක්ෂණයක් පැවැත්වීම.

(9) වීරවිල ගුවන්පථයේ ඇති අලි වැට සහ මායිම් වැට නැවත සකස් කිරීම.

(10) පක්ෂීන්ගේ පහරදීම් තර්ජන පාලනය කිරීම සඳහා පියවරක් ලෙස ගුවන් තොටවල ගුවන් රයිෆල් ස්ථානගත කිරීම.

(11) පියාසර මෙහෙයුම් ආරක්ෂිතව සිදු කිරීම සඳහා අදාළ ප්‍රදේශය තුළ පක්ෂීන්ගේ හැසිරීම් පිළිබඳ දත්ත රැස් කිරීම.

(12) රත්මලාන ශ්‍රීලංගුහ මූලික කඳවුරෙහි බර ප්‍රවාහන හැඟරයේ කටයුතු පහසුවෙන් සිදු කිරීම සඳහා නව ගුවන් ගමන් පාලන (ATC) කුළුණක් ඉදිකිරීම ඇරඹීම.

(13) ශ්‍රීලංගුහ ගුවන් තොටුපල සහ යාත්‍රාංගන සඳහා සුදුසු පක්ෂි විකර්ෂක පද්ධතියක් නිර්මාණය කිරීම පිළිබඳ විශේෂ අධ්‍යයනයක් R&D පක්ෂාංගය විසින් මොරටුව විශ්ව විද්‍යාලය සමග ආරම්භ කරන ලදී.

ඊ. ඉලක්කය 06 මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේදී නිදහස තහවුරු කිරීම හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/ අයථා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) පහත සඳහන් සයිබර් ආරක්ෂණ මෙවලම් අත්කරගන්නා ලදී.
- (අ) Meltigo
- (ආ) AppSpider
- (ඇ) Open Text Encase Digital Forensic

(2) ශ්‍රීලංගුහ සයිබර් මෙහෙයුම් සඳහා පහත සඳහන් නිලධාරීන් සහ ගුවන් භටයින් සංඛ්‍යාවක් පත්කරනු ලැබ ඇත.
- (අ) නිලධාරීන් 02
- (ආ) ගුවන්භට 01 සහ කාන්තා ගුවන්භට 01

(3) ශ්‍රීලංගුහ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය මඟින් පහත දැක්වෙන සයිබර් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

(අ) SLCERT මඟින් සංවිධානය කරන ලද National Hacking Challenge 2021 සඳහා සහභාගි වී ප්‍රති ප්‍රහාර මෙහෙයුම් සඳහා 03 වන ස්ථානය දිනා ගැනිම.

(ආ) විවෘත මූලාශ්‍ර බුද්ධි මෙහෙයුම්

(ඇ) ආරක්ෂක මෙහෙයුම්

i. බස්නාහිර පළාත් සභාවේ වෙබ් අඩවි සඳහා අවදානම පිළිබඳ තක්සේරු වාර්තාව.

ii. කන වසම් ලේඛාධිකාරිය (lk domain registry) පිළිබඳ තොරතුරු ආරක්ෂණ විගණන සහ අවදානම් තක්සේරු වාර්තාව.

iii. එල්.ටී. ටී. ඊ. සයිබර් කණ්ඩායම මඟින් සිදු කරන ප්‍රහාර සාර්ථකව වලක්වා ගැනීම සහ නැවත යථා තත්ත්වයට පත්කරගැනීම.

iv. ජනාධිපති ලේකම් කාර්යාලය සඳහා කලින් කලට අවදානම් තක්සේරු වාර්තාවක් ලබාගැනීම.

vi. ආරක්ෂක අමාත්‍යාංශය සඳහා අවදානම් තක්සේරු වාර්තාව.

vii. ජනාධිපති ලේකම් කාර්යාලයේ විද්‍යුත් තැපැල් සර්වරය සඳහා අවදානම් තක්සේරු වාර්තාවය.

ඌ. ඉලක්කය 07 අමතර සුභසාධන කටයුතු ඇති කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ප්‍රවාසතාව අවම කිරීම හා ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) ශ්‍රීලංගුහ කොවිඩ්-19 රෝගීන් ට සහ ඔවුන්ගේ සමීප ඥාතීන්ට ප්‍රතිකාර කිරීමේ අවස්ථා හා හැකියාව නැංවීම සඳහා කොවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇති කිරීම.

(2) ඇඳන් 03 කින් සමන්විත කොවිඩ්-19 දැඩි සත්කාර ඒකකය ශ්‍රීලංගුහ කොළඹ රෝහලේ ස්ථාපිත කිරීම.

(3) කටුනායක සහ රත්මලාන ශ්‍රීලංගුහ රෝහල් සඳහා කොවිඩ්-19 HDU (High Dependency Unit) ස්ථාපිත කිරීම හා අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීම.

(4) කොවිඩ්-19 වැළැක්වීම සඳහා අවශ්‍ය වන වෛද්‍ය උපකරණ, පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE), විෂ බීජ නාශක හා පිරිසිදු කාරක දියර වර්ග හා වෛද්‍ය අයිතම මිල දී ගැනීම.

(5) කොළඹ ශ්‍රීලංගුහ රෝහලේ අක්ෂි ශල්‍යාගාර පසුකම් උපකරණ සහිතව වැඩි දියුණු කිරීම. (Visual Field Analyzer, High Definition Optical Coherence Tomography System)

(6) කටුනායක ශ්‍රීලංගුහ රෝහලේ ක්‍රීඩා වෛද්‍ය ඒකකය වැඩි දියුණු කිරීම.

(7) කොළඹ ශ්‍රීලංගුහ රෝහලේ පවතින එන්ඩොස්කොපි (endoscopy) පද්ධතිය වැඩි දියුණු කිරීම.

(8) කොළඹ ශ්‍රීලංගුහ රෝහල් වල HDU ඒකක වැඩි දියුණු කිරීම සඳහා බිත්තියට සවි කරන ලද ඔක්සිජන් පද්ධති, Multipara monitors සහ කෘතිම ශ්වසන ආධාරක යන්ත්‍ර (Ventilators) ලබාදීම.

(9) හිඟුරක්ගොඩ ශ්‍රීලංගුහ මූලික කඳවුරේ භෞතික චිකිත්සක ඒකකය සඳහා කෙටි තරංග ඩයතෘමි යන්ත්‍ර (Short Wave Diathermy Machine) මිල දී ගැනීම.

(10) කටුනායක ශ්‍රීලංගුහ රෝහලේ විශ්‍රාමික/සෙසු නිලයන් සඳහා වන වාට්ටුව අවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබා දී සංවර්ධනය කිරීම.

(11) කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුර සඳහා ස්වයංක්‍රීය හිමොග්ලොබින් පරීක්ෂක විශ්ලේෂකයක් (Automated HBA1C Hemoglobin testing analyzer) මිල දී ගැනීම.

(12) දන්ත වෛද්‍ය පහසුකම් අබණ්ඩව වැඩිදියුණු කිරීම හා උසස් තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හරහා ශ්‍රීලංගුහ සාමාජිකයින් හා ඔවුන්ගේ පවුලේ ළඟම සාමාජිකයින් සඳහා ලබා දෙන දන්ත වෛද්‍ය සේවාවන් වැඩිදියුණු කිරීම.

(13) ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතියට ගුවන් හමුදාවේ වෘත්තිය නිපුණතාවයන් සංවර්ධනය කිරීම.

(14) මුඛ රෝග බොහෝ විට සැඟවී ඇති අතර අදෘශ්‍යමාන වේ, නැතහොත් ඒවා ජීවිතයේ හා වයස්ගත වීමේ නොවැළැක්විය හැකි ප්‍රතිඵලයක් ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත්, මුඛ රෝග නොවැළැක්විය හැකි බවට පැහැදිලි සාක්ෂි තිබේ, නමුත් පාඨමාලාවේ සෑම අදියරකදීම පුද්ගල හා ජනගහණ මට්ටමින් සරල හා ඵලදායී පියවර මගින් අඩු කිරීම හෝ වළක්වා ගත හැකිය. එබැවින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය කර ඇත.

(අ) වාර්ෂික දත්ත පරීක්ෂාව
(ආ) නිවාරණ සත්කාර වැඩසටහන.
(ඇ) විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.
(ඈ) පුහුණුව.
(ඉ) මුඛ පිළිකා / OPMDs / දරුණු දත්දිරායෑම් ඇති පුද්ගලයින් සඳහා විශේෂ ලේඛනයක්.
(ඊ) වාර්ෂික දන්ත පරීක්ෂාව, ගුවන් කාර්ය මණ්ඩල යේ දන්ත පරීක්ෂාව සහ පූර්ව මරණ පරීක්ෂණ දත්ත සඳහා දත්ත පද්ධති.

උ. ඉලක්කය 08 ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තිකරණය

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) මධ්‍යම අප්‍රිකානු ජනරජයේ හා දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා අවශ්‍ය බලඇණි හා උපකරණ සැපයීම මගින් ශ්‍රීලංගුහ ට ආදායමක් උපයා ගැනීමට හැකි වීම.

(2) ශ්‍රීලංගුහ විසින් වාණිජ ගුවන් ගමන් 21 ක් වාර්තා කර ඇති අතර රු.14,159,992.37 ක ආදායමක් උත්පාදනය කර ඇත.

(3) CBRNE පක්ෂාංගය විසින් COVID-19 වසංගතය මැඩපැවැත්වීම සඳහා සහභාගී වීම මඟින් රජයට සහාය වීම.

(4) ගොඩබිම් ආරක්ෂණ හැකියාව වැඩි දියුණු කිරීමට ප්‍රසම්පාදන ව්‍යාපෘති සහ සෝදිසි සහ ගලවාගැනීම් ශක්‍යතාවන් වැඩි දියුණු කිරීමට ප්‍රසම්පාදන ව්‍යාපෘති 2021 වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලදි.

(5) මධ්‍යම අප්‍රිකානු ජනරජයේ හා දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා අවශ්‍ය බල ඇණි හා උපකරණ සැපයීම.

එ. ඉලක්කය 09 කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා වෘත්තිමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලියන් සමාලෝචනය කිරීම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) එක් එක් පුද්ගලයා, අංශය, ශාඛාව, අධ්‍යක්ෂකය සඳහා ප්‍රධාන කාර්‍යසාධන දර්ශක හඳුනාගැනීම සහ එවැනි දර්ශක මඟින් කාර්ය සාධනය පිළිබඳ අඛණ්ඩ සමාලෝචනය තුළින් පුහුණු අවශ්‍යතා/ වැඩි දියුණු කළයුතු පුහුණු ක්ෂේත්‍රයන් හඳුනාගැනීම.

(2) ආයතනය තුළ පියාසර ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීම වැඩි දියුණු කිරීම සඳහා පියාසර ආරක්ෂාව පිළිබඳ වැඩමුළුවක් අධිකාරී නොලත් නිලධාරීන් (NCO) සඳහා පත්වන ලදි.

(3) මධ්‍යම අප්‍රිකානු ජනරජයේ සේවයේ යෙදවීම ට පෙර 7 වන MINUSCA බලඇණියෙහි සාමාජිකයින්ගේ කාර්ය මණ්ඩල සම්පත් කළමනාකරණය සංවර්ධනය සහ වැඩි දියුණු කිරීමේ අදහසින් ගුවන් කාර්ය මණ්ඩලයට (නිලධාරීන් සහ ගුවන් භටයින් සඳහා) කාර්ය මණ්ඩල සම්පත් කළමනාකරණ පුහුණුවක් පවත්වන ලදි.

(4) ශ්‍රීලංගුහ සාමාජිකයින් අතර පියාසර ආරක්ෂාව පිළිබඳ දැනුම ඇති කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන පියාසර ආරක්ෂාව පිළිබඳ පෝස්ටර් චිත්‍ර තරගයක් පවත්වන ලදි.

(5) උගත හැකි දේ පිළිබඳ තක්සේරු කිරීම සඳහා පසුගිය ගුවන් අනතුරු සම්බන්ධ වීඩියෝ සහ විමර්ශන වාර්තා ලිපි පියාසර ආරක්ෂක කටයුතු සමග සෘජුවම කටයුතු කරන ශ්‍රීලංගුහ සාමාජිකයින් අතර බෙදා හැරීම මඟින් දැනුම බෙදා ගැනීමේ සහ උගත් පාඩම් වැඩසටහනක් පවත්වන ලදි.

ඒ. ඉලක්කය 10 නව තාක්ෂණය හඳුන්වාදීම හා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.

**ප්‍රධාන ජයග්‍රහණයන්**

2021 නිලධාරීන් 254 දෙනෙකු හා සෙසු නිලයන් 1,324 දෙනෙකු බඳවා ගන්නා ලදී.

ඓ. ඉලක්කය 11 නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මඟින් ශ්‍රීලංගුහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තත්ත්වය පිළිබඳ දැනුවත්වීම වැඩි දියුණු කිරීම

**ප්‍රධාන ජයග්‍රහණයන්**

(1) අක්‍රමිකතාවන් හඳුනාගැනීම සහ අනාවරණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර යෝජනාව ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත භාර දී ඇත. ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා සනාථන සභාව විසින් අනුමත කරනු ලැබ ඇත.

(2) ශ්‍රීලංගුහ මූලස්ථානය සඳහා අකුරේගොඩ DHQC හි දේශීය විධායක සහ පාලන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මූලික යෝජනාව අනුමත කරන ලද අතර සංවර්ධන ක්‍රියාවලිය රත්මලාන අංක 01 තොරතුරු තාක්ෂණ පක්ෂාංගයේ (ITW) දී ආරම්භ විය.

(3) ශ්‍රීලංගුහ දත්ත ජාලයේ උපයෝජ්‍යතාවය ඉහළ නැංවීමට ශ්‍රීලංගුහ පණිවුඩ හුවමාරු ස්ථාන (repeater stations) සඳහා පැය 3 ක කෝෂ උපස්ථයක් සහිත 2 KVA මාර්ගගත අඛණ්ඩ විදුලි සැපයුමක් (UPS) ස්ථාපිත කිරීම.

(4) දත්ත සහ සන්නිවේදන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුරේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල කඳවුර දක්වා නව ෆයිබර් ඔප්ටික් රැහැන් ඇදීම.

(5) මීරිගම ශ්‍රීලංගුහ කඳවුරෙහි ADC&CC සඳහා අකුණු සන්නායක පද්ධතියක් ස්ථාපිත කිරීම.

## 2.1.1 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

### අ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(1) ජාතිය සතු එකම යුධ ගුවන් සේවාව ලෙස, 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඊට අයත් ගුවන්යානා සමූහය විශේෂ/ප්‍රභූ පුද්ගල ගුවන් ගමන්, භට පිරිස්/ මගීන් සහ ගුවන් බඩු තොග ප්‍රවාහනය, ගුවන් ආවේක්ෂණ මෙහෙයුම්, වාණිජ අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය ඇතුළු ජාතික අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා යොදවාගෙන ඇත. කෙසේ නමුත් ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා ගුවන් බලය හැසිරවීමේදී තම සහෝදර සේවාවන්වල (යුධ,නාවික,පොලිස්) සහයෝගය හා අන්‍යෝන්‍ය සබඳතාව ද එක ලෙස වැදගත් විය.

(2) පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් වර්ගීකරණයන් යටතේ 2021 වර්ෂය තුළ පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන 10,926.48 කි.

| අනු අංකය | මෙහෙයුම් වර්ගය | පියාසර පැය |
|---|---|---|
| 01 | ප්‍රභූ පුද්ගල ගුවන් ගමන් | 221.05 |
| 02 | විශේෂ පුද්ගල ගුවන් ගමන් | 131.50 |
| 03 | මෙහෙයුම් | 3,969.50 |
| 04 | පරීක්ෂණ පියාසර කිරීම් | 748.27 |
| 05 | පුහුණු | 5,757.01 |
| 06 | වාණිජ | 37.50 |
| 07 | දිවයිනෙන් බැහැරට පියාසර කිරීම් | 67.15 |
| 08 | ආපදා සහන මෙහෙයුම් | 3.30 |
| **එකතුව** | | **10,926.48** |

**වගුව - 2**




**රූප සටහන - 1**

(3) ගුවනින් ගමන් කල මගීන් සංඛ්‍යාව - 113

(4) පසුගිය වසර 6 තුළ පියාසර පැය ගණන් සැසඳීම පහත පරිදිය.

| මෙහෙයුම් වර්ගය | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| මෙහෙයුම් | 6,961.93 | - | 4,448.40 | 3,793.25 | 3,337.85 | 3,969.50 |
| ඒකාබද්ධ මෙහෙයුම් | - | - | 112.20 | 264.45 | - | - |
| මෙහෙයුම් විදේශීය | - | - | 2,077.55 | 2,165.13 | 2341.64 | - |
| පුහුණු | 6,588.00 | 5,875.38 | 6,412.19 | 7,890.14 | 6868.40 | 5,757.01 |
| ප්‍රභූ පුද්ගල ගුවන් ගමන් | - | 601.30 | 618.15 | 641.50 | 329.85 | 221.05 |
(6) ධර්මපාල බෝසත් ළමා නිවාසය සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකරන ලද අතර, එය හිඟුරක්ගොඩ ශ්‍රීලංගුහ මූලික කඳවුරෙහි අණදෙන නිලධාරී විසින් 2021.11.22 දින විවෘත කරන ලදි.




(7) 2021.12.10 දින හිඟුරක්දමන දක්වා වන පොදු මාර්ගය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.





ඌ. 2021 වර්ෂය තුළ කොළඹ ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු.

(1) කැළණිය රජමහා විහාරයේ පිච්චමල් පූජාව.

(2) වික්ටෝරියා වැඩිහිටි නිවාසයේ අළුත්වැඩියා කටයුතු සහ පිරිසිදු කිරීමේ වැඩසටහන.

ඍ. 2021 වර්ෂය තුළ පලාලි ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු.

(1) 2021 ජන. 17 දින යාපනය අන්තෝනිපුර ප්‍රජා සේවා කාර්යාලය අළුත්වැඩියා කිරීම සහ වැඩි දියුණු කිරීම.





(2) 2021 සැප්.27 දින යාපනය ශික්ෂණ රෝහල සඳහා 'ගුවන් මිතුදම්' ව්‍යාපෘතිය මගින් වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම.





එ. 2021 වර්ෂය තුළ අම්පාර ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

(1) නිදහස් දින සැමරුමට සමගාමීව කඳවුරු භූමිය අසල රුක්රෝපණ වැඩසටහනක් පැවැත්වීම සහ සියළුම අංශ වල පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් කඳවුරු භූමිය අවට ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.




(2) ශ්‍රීලංගුහ සේවා වනිතා ඒකකය මගින් "වැරන්කැටගොඩ විද්‍යාලෝක විද්‍යාලය" සඳහා වැසිකිළි පද්ධතියක් විවෘත කිරීම.




(3) "දමන ප්‍රාදේශීය රෝහල" හි කාන්තා වාට්ටුවේ තීන්ත ආලේප කිරීම.




(4) "අම්පාර රෝහලේ" ලේ දන්දීමේ වැඩ සටහනක් පැවැත්විම.




(5) 'දීඝවාපිය' විහාරස්ථානයේ ධාතු මන්දිරය ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම.

(6) 'සඳහිරු සෑය' චෛත්‍යයේ කොත සහ චූඩා මාණික්‍යය වඩම්මවන ලද පෙරහැර ට සහභාගි වූ 'මහාවාපිය' විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලා 25 නමක් සඳහා දානය පිරිනැමීමේ කටයුත්තක් සිදු කිරීම.





(7) "සමන බැද්ධ පිරිවෙනෙහි" ස්වාමීන් වහන්සේලා සඳහා පාසැල් උපකරණ පිරිනැමීම.





(8) ගුවන් භටයින්ගේ සහභාගිත්වයෙන් 'බුද්ධංගල විහාරයේ' ශ්‍රමදාන ව්‍යාපාරයක් පැවැත්වීම

(9) "හිමිදුරුව විහාරස්ථානයේ" කයින පිංකම පැවැත්වීම.





(10) 32 වැනි කඳවුරු දිනයට සමගාමීව "අරන්තලාව රජමහා විහාරයේ" ශ්‍රමදාන ව්‍යාපාරයක් පැවැත්වීම.





(11) 32 වැනි කඳවුරු දිනයට සමගාමීව "කඳවුරු රෝහලේ දී" ලේ දන්දීමේ වැඩ සටහනක් පැවැත්වීම.






(12) 32 වැනි කඳවුරු දිනයට සමගාමීව සියළුම අංශ වල පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් කඳවුරු භූමිය අසල රුක්රෝපණ වැඩසටහනක් පැවැත්වීම.

(13) 32 වැනි සංවත්සරය සමරමින් අම්පාර ප්‍රදේශයේ දිළිඳු පවුල් 32ක් සඳහා වියලි ආහාර ද්‍රව්‍ය පාර්සල් 32 ක් බෙදා දීම.

(14) 32 වැනි සංවත්සරය සමරමින් පාසැල් ළමුන් 32 දෙනෙකු සඳහා පාසැල් බෑග්, පොත් හා ලිපි ද්‍රව්‍ය බෙදා දීම.

(15) 32 වැනි සංවත්සරය සමරමින් අම්පාර ප්‍රදේශයේ තෝරා ගත් පෙර පාසැල් 05 ක් සඳහා ලිපි ද්‍රව්‍ය බෙදා දීම.

ඒ. 2021 වර්ෂය තුළ පලාවි ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු

(1) 'ගුවන් මිතුදම්' ව්‍යාපෘතිය යටතේ කන්දයාය, පුත්තලම ප්‍රජාවට බෙහෙත් ශාලාවක් සඳහා ගෙඩනැගිලිගත් ඉදිකරවා දීම.





(2) පුත්තලම, කල්ලඩි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පුස්තකාලයට ලී බඩු (මේස සහ පොත් රාක්ක)





ඓ. 2021 වර්ෂය තුළ ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු.

(1) ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුරේ 10වන සංවත්සරය නිමිත්තෙන් 2021 අගෝස්තු 03 දින රාමනාදපුර ට්‍රයස්ට් කන්‍යාරාමයේ දරුවන්ට දිවා ආහාරය සහ ආධාර ලබා දීමේ වැඩසටහනක් පැවැත්වීම.

(2) 2022 ඔක්. 07 දින සමාජ සත්කාරක ව්‍යාපෘතියක් ලෙස ඔක්සිජන් සිලින්ඩර 04ක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත භාරදීම.

(3) ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුර ස්ථාපිත කරන ලද මුල් අවස්ථාවේ දී කඳවුර අවට බොහෝ ගම්වාසීන් විසින් ශ්‍රීලංගුහ ට පානීය ජලය ලබාදීම ප්‍රතික්ෂේප කළ තත්ත්වය මත සේවා පුද්ගලයින් ට පානීය ජලය ලබා දුන් අඩු ආදායම්ලාභී පවුලකට මසකට දෙවරක් වියළි ආහාර පාර්සල් 02 බැගින් පරිත්‍යාග කිරීම.

(4) සිවිල් පුද්ගලයින්ට නිරෝධායන මධ්‍යස්ථානයක් ඇති කිරීම.

ඔ. 2021 වර්ෂය තුළ මුලතිව් ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය

(1) කෙප්පාපිලයි දෙමළ මිශ්‍ර පාසලට පුස්තකාල ගොඩනැගිල්ලක් තනා දීම හා පොත් රාක්ක පරිත්‍යාග කිරීම.





(2) තන්නිරුතු දෙමළ මිශ්‍ර පාසලේ ප්‍රථමාධාර කාමරය අළුත්වැඩියා කර ප්‍රථමාධාර අයිතම පරිත්‍යාග කිරීම.





(3) මුල්ලයාවලි රෝහල හා එක්ව මුලතිව් ගුවන් හමුදා කඳවුරේ ලේ දන් දීමේ වැඩ සටහනක් පැවැත්වීම.





ඕ. 2021 වර්ෂය තුළ මඩකලපුව ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

(1) 2021 මාර්තු 02 දින BT/BT වලයිසිරාවු මෙතෝදිස්ත සභා දමිළ පාසැල අළුත්වැඩියා කර භාර දීම.

(2) මඩකළපුව නගරයේ පිහිටි ගාන්ධි උද්‍යානය පිළිසකර කර මඩකළපුව නගරාධිපති වෙත භාර දීම.

ඔ෭.  2021 වර්ෂය තුළ වීරවිල ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

(1)  2021 මාර්තු 15 දින වීරවිල මහා විද්‍යාලයේ ශ්‍රමදාන ව්‍යාපාරයක් පැවැත්වීම. මේ සඳහා ගුවන් හටයින් 20 දෙනෙකු සහභාගි විය.





(2)  වෙහෙරගල රජමහ විහාරයේ භික්ඛු ආවාසගෙය අළුත්වැඩියා කිරීම - මෙම කාර්යය වීරවිල ශ්‍රීලංගුහ කඳවුර මගින් සිදු කරන ලදි.





(3)  වීරවිල මහා විද්‍යාලයේ සේවා වනිතා වැඩසටහන - ශ්‍රීලංගුහ මූලස්ථාන සේවා වනිතා ඒකකය මගින් සැලසුම් කරන ලද ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ශාලාව සහ අත්හැර දමා තිබූ වැසිකිළි පද්ධතියක් අළුත්වැඩියා කිරීම.





(4)  2021 නොවැම්බර් 11 දින වෙහෙරගල සේනාසනය ට දාන ශාලාවක් ඉදිකර දීම.





ක.  2021 වර්ෂය තුළ කොග්ගල ශ්‍රීලංගුහ කඳවුර මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය

(1) හබරාදුව අමන්තයාන ප්‍රාථමික පාසැලේ දී පොත් ලබා දීමේ වැඩසටහනක් පැවැත්වම.





(2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වැනි සංවත්සරයට සමගාමීව සමාජ සත්කාරක ව්‍යාපෘතියක් ලෙස හබරාදුව වෘත්තීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරන ලදි.





(3) මීපේ ප්‍රාදේශීය රෝහල සඳහා අළුතෙන් ඉදිකරන ලද COVID-19 ඔක්සිජන් ප්‍රතිකාර මධ්‍යස්ථානය වෛද්‍ය කාර්ය මණ්ඩලය වෙත භාර දෙන ලදි. එම අවස්ථාවේ දී පෞද්ගලික ආරක්ෂණ උපකරණ (PPE Kits) කට්ටලයක් ද වෛද්‍ය කාර්ය මණ්ඩලය වෙත භාර දෙන ලදි.






(4) 37 වැනි කඳවුරු දිනයට සමගාමීව ලේ දන් දීමේ වැඩ සටහනක් පැවැත්වීම. මෙම වැඩ සටහන ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ ලේ බැංකුව සමග එක්ව සිදු කරන ලදි.





(5) 37 වැනි කඳවුරු දිනයට සමගාමීව උණවටුණ පිල්ලගොඩ සුමනජෝති මහා විද්‍යාලයේ දී "ශ්‍රමදාන ව්‍යාපාරයක්" පැවැත්වීම.





(6) හබරාදුව "සෝමාවතී ළමා නිවාසය" සඳහා ආධාර ලබා දීමේ වැඩ සටහනක් පැවැත්වීම.







(7) මාස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) MAS Holding (Pvt) Ltd සමග එක්ව කොග්ගල MAS Intimates ආයතනයේ සේවයේ නියුතු වෙනස් ආබාධිත තත්ත්වයන් සහිත වෘත්තිකයන් සඳහා සමාජ සත්කාරක ව්‍යාපෘතියක් කැටලිනා ග්‍රිල් ගුවන්යානා පරිශ්‍රයේ දී පවත්වන ලදි.





(8) කොග්ගල මුහුදු වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.





ඛ. 2021 වර්ෂය තුළ මොරවැව ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත පරිදිය.

(1) දිවුල්වැව ප්‍රදේශයේ නව පානීය ජල පද්ධතියක් සකස් කිරීම සහ පානීය ශ්‍රීලංගුහ මූලස්ථාන සේවා වනිතා ඒකකය මගින් සැලසුම් කරන ලද ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ අළුතෙන් ප්‍රතිසංස්කරණය කරන ලද දිවුල්වැවයාය 06 ප්‍රාථමික පාසල 2021 මාර්තු 29 දින සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වන චාමිනී පතිරණ මහත්මිය විසින් විවෘත කරන ලදි.





(2) 70 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් කණුගහවැව ආදර්ශ ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද අලි වැට විවෘත කිරීමේ උත්සවය 2021 අප්‍රේල් 04 වන දින පවත්වන ලදි.





(3) ජාතික රණවිරු දින සැමරුම නිමිත්තෙන් 2021 මැයි 19 දින ගජබා ලෙන් විහාරයේ දානමය පිං කමක් පැවැත්වීම.

(4) 2021 ජුනි 03 දින කඳවුරු රෝහලේ දී ලේ දන් දීමේ වැඩසටහනක් පැවැත්වීම.





(5) 2021 ජුනි 12 දින ආගමික ස්ථානයකට හා සිවිල් පුද්ගලයින්ට වියලි ආහාර පාර්සල් ලබාදීමේ වැඩ සටහනක් පැවැත්වීම.





(6) 2021 ජුනි 30 දින කඳවුරු විහාරස්ථානයේ සන්ධ්‍යාර කුළුණ ඉදි කිරීම.

(7) කඳවුරේ 48 වැනි සංවත්සරය නිමිත්තෙන් 2021 ජූලි 28 වන දින කඳවුරු රෝහලේ දී ලේ දන් දීමේ වැඩ සටහනක් පැවැත්වීම.

(8) කඳවුරේ 48 වැනි සංවත්සරය නිමිත්තෙන් 2021 ජූලි 28 වන දින ගජබා ලෙන් විහාරයේ දී "ශ්‍රමදාන ව්‍යාපාරයක්" පවත්වන ලදි.

(9) කඳවුරේ 48 වැනි සංවත්සරය නිමිත්තෙන් 2021 ජූලි 28 වන දින මොරවැව වැව අසල දී පරිසරය පිරිසිදු කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි.

(10) 2021 සැප්. 24 වන දින මොරවැව ප්‍රදේශයේ සේවා වනිතා නිවසක් ඉදි කිරීම.







(11) 2021 දෙසැම්බර් 03 දින කඳවුරු රෝහලේ දී ලේ දන් දීමේ වැඩ සටහනක් පැවැත්වීම.

ග. 2021 වර්ෂය තුළ මීරිගම ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

(1) බොකලගම ප්‍රාථමික පාසැලේ අබලන් වූ වැසිකිළි දෙකක් අළුත්වැඩියා කිරීම.





(2) මීරිගම ශාසනවර්ධන මහා බෝධි ළමා නිවාසයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම සහ ලිපිද්‍රව්‍ය ලබා දීම.





(3) ‘ගුවන් මිතුදම්’ සේවා වනිතා වැඩසටහන මගින් දරුවන්ට පාසැල් උපකරණ ලබා දීම සහ කිතුල්වෙල ගමේ ගොවීන්ට ඉසින යන්ත්‍ර ලබා දීම.





ඍ. 2021 වර්ෂය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

‘ගුවන් මිතුදම්’ ව්‍යාපෘතිය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ශ්‍රීලංගුහ කඳවුර විසින් සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වන චාමිනී පතිරණ මහත්මිය ගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මත කරන ලදි. මෙම ව්‍යාපෘතිය මගින් මිනුවන්ගොඩ මූලික රෝහලට අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා දෙන ලදි.

| | | | |
|---|---|---|---|
| (අ) | ඔක්සිජන් ගෙනයන කරත්ත | - | 05 Ea |
| (ආ) | Non breathable මුව ආවරණ (වැඩිහිටි) | - | 150 Ea |
| (ඇ) | Non breathable mask (ළමා) | - | 35 Ea |
| (ඈ) | ස්වායු ඔක්සිජන් මුව ආවරණ | - | 190 Ea |
| (ඉ) | තේ කොල | - | 40 Kg |





ඎ. 2021 වර්ෂය තුළ පිදුරුතලාගල ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය

(1) 2021 ජනවාරි 05 වන දින කඳවුරු දින සැමරුම නිමිත්තෙන් ග්‍රෙගරි වැව සහ ඒ අවට පිරිසිදු කිරීම සඳහා ශ්‍රමදාන වැඩ සටහනක් පැවැත්වීම.

(2) මාර්තු 02 දින ග්‍රෙගරි වැව අවට රුක් රෝපණ වැඩ සටහනක් පැවැත්වීම.

(3) 2021 මාර්තු 04 දින 70 වැනි ගුවන් හමුදා සංවත්සරය නිමිත්තෙන් කඳවුරු අණදෙන නිලධාරී, නිලධාරීන් සහ ගුවන් භටයින්ගේ සහභාගිත්වයෙන් නුවරඑළිය පේන්ටර්ස් හෝම් හි දී දානමය පිංකමක් පැවැත්වීම.

(4) පිදුරුතලාගල ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සේවා වනිතා ඒකකය මගින් කොත්මලේ ශ්‍රී සුමංගල ප්‍රාථමික විදුහලේ දී 2021 නොවැම්බර් 29 දින පහත වැඩ සටහන් පවත්වන ලදි.

(අ) පන්ති කාමර අළුත්වැඩියා කිරීම.

(ආ) විදුලි රැහැන් පද්ධතියක් සවි කිරීම.

ච. 2021 වර්ෂය තුළ චීනවරාය ශ්‍රීලංගුහ විද්‍යාපීඨය මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

(1) 2021 පෙබරවාරි 27 දින 22 වැනි JC&SC කඳවුරු දිනය නිමිත්තෙන් 5වැනි සැතපුම් කණුව අසල පිහිටි රේවත ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදි.

(2) 2021 මාර්තු 03 වන දින 5වැනි සැතපුම් කණුව අසල පිහිටි රේවත ළමා නිවාසයේ දී දානමය පුණ්‍ය කර්මයක් සිදු කරන ලදි.

(3) චීනවරාය නාලන්දා විද්‍යාලයේ පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කර 2021 මාර්තු 30 දින දරුවන් වෙත භාර දෙන ලදි. තව ද, පාසැල ට පුස්තකාල පොත් ද පරිත්‍යාග කරන ලදි.

(4) 2021 ජුනි මස කන්තලේ පිහිටි මෙම විද්‍යාපීඨයේ සිවිල් පුද්ගලයෙකුගේ නිවසක් අළුත්වැඩියා කරන ලදි.

(5) 2021 ඔක්තෝබර් 04 වන දින කප්පල්තුරෙයි ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් 37 දෙනෙකු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහිත පාර්සල් බෙදාදීමේ සමාජ සත්කාරයක් සිදු කරන ලදි.

(6) අංක 06 ADRS හි 12 වැනි කඳවුරු දිනය සමරමින් 2021 ඔක්. 15 දින රේවත ළමා නිවාසයට දානයක් පිරිනමන ලදි.

(7) අංක 06 ADRS හි 12 වැනි කඳවුරු දිනය සමරමින් "සමුද්‍රාසන්න විහාරයේ" ශ්‍රමදාන වැඩ සටහනක් පැවැත්වීම.

(8) ගොඩබිම් පුහුණු පක්ෂාංගයේ 28 සංවත්සරය සමරමින් ත්‍රිකුණාමලය රේවත ළමා නිවාසයට මූලිකව අවශ්‍ය ද්‍රව්‍ය ඇතුළු වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීම.

ඡ. 2021 වර්ෂය තුළ ශ්‍රීලංගුහ දියතලාව සටන් පුහුණු පාසැල මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු පහත පරිදිය.

(1) 2021 මාර්තු 02 දින දියතලාව ප්‍රධාන බස් නැවතුම් පොල සහ මිනින්දෝරු හා සිතියම් කඳවුර අසල ඇති බස් නැවතුම් පොල අළුත්වැඩියා කිරීම.






(2) 2021 මාර්තු 12 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70වැනි සංවත්සරය වෙනුවෙන් ශ්‍රී පාද ස්ථානය අවට පරිසරය පිරිසිදු කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි.





(3) 2021 ඔක්තෝබර් 14 දින දියතලාව මධ්‍ය මහා විද්‍යාලයේ සහ කහගොල්ල ජාතික පාසැලේ ශ්‍රමදාන වැඩ සටහනක් පැවැත්වීම.





ජ. 2021 වර්ෂය තුළ ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසැල මගින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත පරිදිය

(1) 70 වැනි ගුවන් හමුදා සංවත්සරය නිමිත්තෙන් ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසැල මගින් කොටුගොඩ රෝමානු කතෝලික ප්‍රාථමික පාසැලේ දරුවන් 325 දෙනෙකු හට පාසැල් පොත් සහ බෑග් බෙදා දෙන ලදි. ඊට අමතරව විශේෂ අවශ්‍යතා ඇති දරුවන් 25 දෙනෙකු ට විශේෂ තෑග ලබාදෙන ලදි. වැඩි දුරටත් ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසැල මගින් 2021 මාර්තු 23 වැනි දින පාසැල් ගොඩනැගිල්ල පිළිසකර කරන ලදි.





(2) 2021 දෙසැම්බර් 23 දින සීදුව, ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත සමාජයේ නත්තල් සාදයේ දිවා අහාරය සඳහා පාර්සල් 200 ක් ලබා දීම.





ඣ. 2021 වර්ෂය තුළ ශ්‍රීලංගුහ රෙජිමේන්තු පුහුණු පාසල වන්නි විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිලිබඳ තොරතුරු.

(1) පෙබරවාරි 04 නිදහස් දිනය වෙනුවෙන් වන්නි ශ්‍රීලංගුහ රෙජිමේන්තු පුහුණු පාසල් රෝහලෙහි ලේ දන්දීමේ කඳවුරක් පැවැත්වීම.

(2) 70 වැනි ගුවන් හමුදා සංවත්සරය නිමිත්තෙන් 2021 පෙබරවාරි 25 දින පුවරසන්කුළම රෝහලේ පිළිසකර කරන ලද වාට්ටුව විවෘත කිරීම සිදු කරන ලදි.

(3) 2021 ජූලි 22 දින වවුනියාව රෝහලේ ලේ බැංකුවේ අනුග්‍රහයෙන් කඳවුරු රෝහලේදී ලේ දන්දීමේ කඳවුරක් පැවැත්වීම.

(4) "සේවා වනිතා ගුවන් මිතුදම් ව්‍යාපෘතිය" මගින් "ශ්‍රී කෘෂ්ණා විද්‍යාලය - සින්නතම්පනෙයි" පාසැල් ගොඩනැගිල්ල සහ ළදරු පාසැල අළුත්වැඩියා කර 2021 නොවැම්බර් 29 දින දරුවන් වෙත භාර දීම සිදු කරන ලදි.

## 2.2 ඉදිරි දැක්ම

**2021-2023 කාල පරාසය සඳහා වන සංයුක්ත සැලැස්මෙහි** අන්තර්ගත ඉලක්ක හා අරමුණු වෙත ලඟා වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව උපායමාර්ගික ඉලක්ක සහ උපායමාර්ගික අරමුණු පහත පරිදි ස්ථාපිත කර ඇත.

| උපායමාර්ගික ඉලක්ක | උපායමාර්ගික අරමුණු |
|---|---|
| **ඉලක්කය 01**<br><br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවයන් ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම් | **අරමුණ 1.1** ශ්‍රී ලංකා ගුවන් සීමාව තුළ ඕනෑම ආකාරයේ ගුවනින් පැමිණෙන සතුරු තර්ජනයක් අනාවරණය, හඳුනාගැනීම හා විනාශකිරීමට ඇති ගුවන් ආරක්ෂක හැකියාවන් වැඩිදියුණු කිරීම. |
| | **අරමුණ 1.2** රේඩාර් ආවරණයේ හිඩැස් පියවීම සඳහා උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථාන වල අතර රේඩාර් ඒකක පිහිටුවා දැනට පවතින රේඩාර් ආවරණය තවදුරටත් පුළුල් කිරීම. |
| | **අරමුණ 1.3** දත්ත කළමනාකරණය/ තත්කාලීන තොරතුරු සැපයීමට සාපේක්ෂව BMC සහ ගුවන් ආරක්ෂණ අණ සහ පාලන මධ්‍යස්ථානවල ශක්‍යතා මට්ටම් ඉහළ නැංවීම. |
| | **අරමුණ 1.4** සිවිල් අධිකාරී මෙහෙයුම් සඳහා යුධ ආධාර දීම (MACA) මෙන්ම මිත්‍ර හමුදාවන් සඳහා දිවා/රාත්‍රී හා ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ මූලෝපායික, මෙහෙයුම්ගත හා උපායමාර්ගික ගුවන් ප්‍රවාහන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාවයන් වැඩිදියුණු කිරීම. |
| | **අරමුණ 1.5** ප්‍රභූ/විශේෂ පුද්ගලයින් ගුවනින් ප්‍රවාහනය කිරීම සඳහා වන හැකියාව වර්ධනය කිරීම. |
| | **අරමුණ 1.6** පවතින තත්ත්වයන් සඳහා අවශ්‍ය අවි අඛණ්ඩව පවතින බව සහතික කිරීම. |
| | **අරමුණ 1.7** ගුවනින් ගොඩබිමට ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව නැවත ලබා ගැනීම. |
| | **අරමුණ 1.8** ගුවන් හමුදාවේ පියාසර පුහුණුව වැඩිදියුණු කිරීම. |
| | **අරමුණ 1.9** ගුවන්යානා නඩත්තු හා සේවා කටයුතු සඳහා අවශ්‍ය ගොඩබිම් සහයක සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීම. |
| | **අරමුණ 1.10** ගොඩබිම් සංචලනය නිරන්තරයෙන් ලබා දීම පිළිබඳව සහතික කිරීම. |
| **ඉලක්කය 02**<br><br>අනන්‍ය ආර්ථික කලාපයද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික සහ උපායශීලී ගුවන් නිරීක්ෂණ සහ සෝදිසි කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම. | **අරමුණ 2.1** රේඩාර් ආවරණයේ හිඩැස් පියවීම සඳහා උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථාන වල අතර රේඩාර් ඒකක පිහිටුවා දැනට පවතින රේඩාර් ආවරණය තවදුරටත් පුළුල් කිරීම. |
| | **අරමුණ 2.2** අනන්‍ය ආර්ථික කලාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ දිවා/රාත්‍රී හා සියලුම කාලගුණික තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක කළ හැකි සමුද්‍රීය ආවේක්ෂණ හැකියාවන් අත්පත් කර ගැනීම. |
| | **අරමුණ 2.3** ආවේක්ෂණ හා නිරීක්ෂණ කාර්යයන්ට සහය වීම සඳහා නියමුවන් රහිත ගුවන්යානා අත්පත් කරගැනීම. |
| | **අරමුණ 2.4** දත්ත කළමනාකරණය/ තත්කාලීන තොරතුරු සැපයීමට සාපේක්ෂව BMC සහ ගුවන් ආරක්ෂණ අණ සහ පාලන මධ්‍යස්ථානවල ශක්‍යතා මට්ටම් ඉහළ නැංවීම. |

| උපායමාර්ගික ඉලක්ක | උපායමාර්ගික අරමුණු |
|---|---|
| **ඉලක්කය 03**<br><br>ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු පිළිබඳ ඒකකය පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් හඳුන්වා දීම. | **අරමුණ 3.1** ගුවන හා ගොඩබිම පාදක කරගත් ඉලෙක්ට්‍රොනික යුධ පද්ධති (EW Suite) අත්පත් කරගැනීම. |
| | **අරමුණ 3.2** මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හා සහෝදර සේවාවන්වල ගොඩබිම් හා ගුවන් සංවේදක ඒකාබද්ධ කිරීම. |
| | **අරමුණ 3.3** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු සම්බන්ධ ක්‍රියාකාරකම්වල සමස්ථ සම්බන්ධීකරණය සඳහා ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු කළමනාකරණය කිරීමේ ඒකකයක් පිහිටුවීම. |
| **ඉලක්කය 04**<br><br>වැදගත් ගුවන් වත්කම් සහ ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම සහ VAs සහ VPs සඳහා ආරක්ෂාව සැපයීම. | **අරමුණ 4.1** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්/ගොඩබිම් වත්කම් සහ ගුවන් හමුදාව තුළ හා ඉන් පිටත VAs හා VPs සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ දැනුම්දීම පරිදි ස්ථිරිය ආරක්ෂාව සැලසීම හරහා ගොඩබිම් ආරක්ෂණ හැකියාවන් වර්ධනය කිරීම. |
| | **අරමුණ 4.2** වැදගත් ගුවන් වත්කම් හා ස්ථාපිතයන් සඳහා ගොඩබිම් පාදක කරගත් ගුවන් ආරක්ෂණ පද්ධති හරහා පුළුල් ගොඩබිම් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම. |
| **ඉලක්කය 05**<br><br>දිවා/රාත්‍රී/සියලුම කාලගුණික තත්ත්ව වලදී මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම හා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථ සංවර්ධනය කිරීම. | **අරමුණ 5.1** වැදගත් ගුවන් වත්කම් හා ස්ථාපිතයන් සඳහා ගොඩබිම පාදක කරගත් ගුවන් ආරක්ෂණ පද්ධති හරහා පුළුල් ගොඩබිම් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම. |
| | **අරමුණ 5.2** ගුවන් ගමන් සඳහා වන ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථවල පියාසර කිරීමේදී අවශ්‍ය සහයන්, ගොඩබෑමේදී අවශ්‍ය සහයන්, ගිනි නිවීමේ කටයුතු, ගුවන් ගමන් පාලනය සහ ගොඩබිම් සහයක පහසුකම් සංවර්ධනය කිරීම. |
| | **අරමුණ 5.3** අදාළ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථවල පිහිටි ගෘහස්ථ ගුවන් ධාවනපථ නඩත්තු කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම. |
| **ඉලක්කය 06**<br><br>මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේදී නිදහස තහවුරු කිරීම හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/අයථා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම. | **අරමුණ 6.1** සයිබර් ප්‍රහාරයන් සමඟ සටන් කිරීමට හා සයිබර් අවකාශය උපයෝජනය කිරීමට ඇති නිපුණත්වය වැඩි කිරීම. |
| | **අරමුණ 6.2** ශ්‍රී ලංකා ගුවන් හමුදා සයිබර් ජාලය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සයිබර් ආරක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම හා දැනට පවතින තොරතුරු තාක්ෂණ සේවාවන්වල විශ්වාසනීයත්වය වැඩි කිරීම මඟින් අවසර නොලත් සයිබර් පිවිසුම් වළක්වා ගැනීම. |
| | **අරමුණ 6.3** ශ්‍රී ලංකා ගුවන් හමුදා සයිබර් යුධ කටයුතු සඳහා වන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා සයිබර් යුධ කටයුතු සඳහා වන යටිතල පහසුකම් හා විධාන ව්‍යුහය පුළුල් කිරීම. |
| **ඉලක්කය 07**<br><br>අමතර සුභසාධන කටයුතු ඇති කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ප්‍රවාසතාව අවම කිරීම හා ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම. | **අරමුණ 7.1** ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින් ඔවුන්ගේ පවුලේ ළඟම සාමාජිකයින් හා විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා ආර්ථික හා සමාජීය රැකවරණයක් ලබා දීමේ ක්‍රියාවලියක් ඇති කිරීම. |
| | **අරමුණ 7.2** නව සංකල්පයන්, ක්‍රියාවලින් හා පද්ධතීන් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන, නීති හා සැපයුම් පද්ධති වැඩිදියුණු කිරීම. |
| | **අරමුණ 7.3** වෛද්‍ය සේවාවන් හා පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා පුද්ගලයින් හා ඔවුන්ගේ පවුලේ ළඟම සාමාජිකයින් සඳහා වෛද්‍ය සේවාවන් ලබා දීම ඉහළ නැංවීම. |
| | **අරමුණ 7.4** ගෝලීය වශයෙන් සම්මත ප්‍රමිතීන්ට සමානව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෘත්තීමය නිපුණතාවයන් ඉහළ නැංවීම. |

| උපායමාර්ගික ඉලක්ක | උපායමාර්ගික අරමුණු |
|---|---|
| **ඉලක්කය 08**<br><br>ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තිකරණය. | **අරමුණ 8.1** රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී ජාතිය ගොඩනැඟීමේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබා දීම. |
| | **අරමුණ 8.2** එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්වල ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භූමිකාව වැඩිදියුණු කිරීම. |
| | **අරමුණ 8.3** පෞද්ගලික ගුවන්ගමන් මෙහෙයවන්නන් දිරිමත් කිරීමේ අරමුණින් වාණිජ මගී ගුවන් ගමන් මෙහෙයුම්වල අඛණ්ඩව නිරත වීම. |
| | **අරමුණ 8.4** ස්වභාවික විපත් අවම කිරීමට හා සිවිල් ප්‍රජාව උදෙසා ආධාර වීමට ගොඩබිම් සංචලතාව ඉහළ නැංවීම. |
| | **අරමුණ 8.5** රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී රසායනික,ජීව විද්‍යාත්මක,විකිරණශීලී, නෘෂ්ටික සය පුපුරන ද්‍රව්‍ය (CBRNE) මඟින් ඇතිවන තර්ජන වලට එරෙහිව ක්‍රියාකාරී ලෙස සහභාගි වීම. |
| | **අරමුණ 8.6** රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී සහ සම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජන ඇති වූ විට රජයට සහාය වීම සඳහා තර්ජන වලට එරෙහිව ක්‍රියාකාරී ක්‍රියාකාරී ලෙස සහභාගි වීම ලෙස සහභාගි වීම. |
| **ඉලක්කය 09**<br><br>කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා ව්‍යෘත්තිමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලියන් සමාලෝචනය කිරීම. | **අරමුණ 9.1** සමාලෝචනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම හා අවශ්‍ය වෙනස්කම් ක්‍රියාවට නැංවීම. |
| | **අරමුණ 9.2** ජාතික හා ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම. |
| **ඉලක්කය 10**<br><br>පටිපාටිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම. | **අරමුණ 10.1** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආයතනික ඉලක්ක හා අරමුණු සඵලදායිව ලඟා කර ගැනීම සඳහා එහි මානව සම්පත නිවැරදි ප්‍රමාණයේ රඳවා ගැනීම. |
| | **අරමුණ 10.2** අනාගතයේදී නිවැරදි ප්‍රමාණයේ මානව සම්පතක් හිමි ආයතනයක් ගොඩ නැගීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලියන් සැලසුම් කිරීම. |
| **ඉලක්කය 11**<br><br>ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ තත්ත්වය පිළිබඳ දැනුවත්භාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මඟින් වැඩි දියුණු කිරීම. | **අරමුණ 11.1** නියමිත ඉලක්ක වර්ගීකරණය සහ හඳුනා ගැනීම සඳහා ආවේක්ෂණ සහ සෝදිසි හැකියාවන් වැඩි දියුණුව. |
| | **අරමුණ 11.2** ක්‍රියාකාරී තීරණ (C2 සහ කළමනාකරණ සේවා, බුද්ධි සහ ආවේක්ෂණ, maneuver services, ප්‍රවර්ථන සේවා, පුද්ගල සේවා සහ ඉදිකිරීම් සේවා) සහ තොරතුරු අත්‍යවශ්‍ය සේවා (ආරක්ෂක ක්‍රමයන්, GIS සේවා, තොරතුරු කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව, තොරතුරු හුවමාරුව, සහයක සේවා සහ සේවා කළමනාකරණය) අතර මුහුණත සීමාවන් වර්ධනය කිරීම. |
| | **අරමුණ 11.3** හමුදා මෙහෙයුම් සහ සන්නිවේදන අරමුණු සඳහා උපායමාර්ගික තොරතුරු කළමනාකරණ වේදිකාවක් ඇති කිරීම. |

# 3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මුල්‍ය කාර්යසාධනය

## 3.1 මුල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒඑෆ්-එස්

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2021 රු. | | සටහන | සමාන 2021 රු. | සමාන නැවත ඇලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒඑෆ්-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | - | - | |
| 120,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 10,574,308 | 20,517,051 | |
| 120,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 10,574,308 | 20,517,051 | |
| | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අරමුදල් | | 39,161,497,000 | 39,200,550,018 | ඒඑෆ්-3 |
| - | තැන්පතු | | 49,491,164 | 212,615,427 | ඒඑෆ්-4 |
| 380,000,000 | අත්තිකාරම් ගිණුම් | | 316,009,728 | 132,031,297 | ඒඑෆ්-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 380,000,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 39,526,997,892 | 39,545,196,742 | |
| 500,000,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 39,537,572,200 | 39,565,713,793 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 2,810,324,026 | 333,219 | |
| 500,000,000 | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ) | | 36,727,248,174 | 39,565,380,574 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | ප්‍රතිරාවර්තන වියදම් | | - | | |
| 30,672,400,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 29,322,342,568 | 29,654,691,090 | |
| 9,154,750,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 6,195,787,813 | 6,498,418,233 | ඒඑෆ්-2(ii) |
| 120,950,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 112,452,856 | 71,938,184 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් ප්‍රතිරාවර්තන වියදම් | 9 | - | - | |
| 39,948,100,000 | මුළු ප්‍රතිරාවර්තන වියදම් (ඊ) | | 35,630,583,238 | 36,225,047,508 | |
| | මූලධන වියදම් | | | | |
| 3,887,000,000 | මූලධන වත්කම් ප්‍රතිරුස්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 4,154,965,013 | 2,126,642,363 | |
| 6,174,490,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,265,628,114 | 1,898,013,532 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒඑෆ්-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 570,000,000 | හැකියා වර්ධනය | 14 | 279,410,449 | 134,478,038 | |
| 1,025,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 406,884,548 | 194,438,027 | |
| 11,656,490,000 | මුළු මූලධන වියදම් (උ) | | 6,106,888,124 | 4,353,571,961 | |
| | තැන්පතු ගෙවීම් | | 62,313,545 | 409,428,340 | ඒඑෆ්-4 |
| 400,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 349,775,530 | 123,587,799 | ඒඑෆ්-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| 400,000,000 | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 412,089,075 | 533,016,139 | |
| 52,004,590,000 | මුළු වියදම් ඔ = (ඊ+උ+ඌ) | | 42,149,560,437 | 41,111,635,607 | |
| (51,504,590,000) | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඔ) | | (5,422,312,263) | (1,546,255,033) | |
| | අරමුදල් සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (5,422,312,263) | (1,546,259,033) | ඒඑෆ්-7 |
| | දෙසැම්බර් 31 දිනට අරමුදල් ශේෂය | | - | 4,000 | ඒඑෆ්-3 |
| | | | (5,422,312,263) | (1,546,255,033) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එෆ්ඒ-පී

**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එෆ්ඒ-6 | 116,426,145,442 | 112,478,490,205 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | එෆ්ඒ-5/5(ඒ) | 301,602,727 | 267,836,925 |
| මුදල් හා මුදල් සමාන දෑ | එෆ්ඒ-3 | - | 4,000 |
| **මුළු වත්කම්** | | **116,727,748,169** | **112,746,331,130** |
| **ඉද්ධ වත්කම් / ඍණාන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම් | | 206,507,384 | 159,919,201 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 116,426,145,442 | 112,478,490,205 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | එෆ්ඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| නැන්පතු ගිණුම් | එෆ්ඒ-4 | 95,095,343 | 107,917,724 |
| අග්‍රිම ශේෂය | එෆ්ඒ-3 | - | 4,000 |
| **මුළු වගකීම්** | | **116,727,748,169** | **112,746,331,130** |

පිටු අංක 01 සිට 53 දක්වා එෆ්ඒ 1 සිට එෆ්ඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 106 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙකිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස්කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකාරී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
දිනය : 22/02/2022

ගණකාධිකාරී
ගුවන් හමුදාධිපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2022.02.22

ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 21.02.2022

## 3.3 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය

ඒකීය-ඉ

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | කණ්ඩායම | |
|---|---|---|
| | 2021 රු. | නැවත ඉදිපන් ලද 2020 රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 10,574,308 | 20,517,051 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම් | 4,683,480,928 | 1,242,729,801 |
| අග්‍රිම ලැබීම් | 39,161,497,000 | 39,200,550,018 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 313,460,593 | 129,267,384 |
| තැන්පතු ලැබීම් | 49,491,164 | 212,615,428 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 44,218,503,993 | 40,805,679,681 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 38,892,101,321 | 38,555,174,788 |
| සහනාධාර සහ මාරුකිරීම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් | 909,508,455 | 965,826,063 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,810,324,026 | 333,219 |
| අත්තිකාරම් ගෙවීම් | 347,877,131 | 120,826,808 |
| තැන්පතු ගෙවීම් | 62,313,545 | 393,900,940 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 43,022,124,477 | 40,036,061,818 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | 1,196,379,516 | 769,617,864 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | 13,363,145 | 10,312,739 |
| ලාභාංශ | - | - |
| භෞතික වත්කම් විකිණීම් | 8,065,092 | 24,906,029 |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | 21,428,237 | 35,218,768 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,217,811,753 | 805,165,809 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 1,217,811,753 | 805,165,809 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | (1,196,383,516) | (769,947,041) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | (4,000) | (329,177) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ඉද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | (4,000) | (329,177) |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | 4,000 | 333,177 |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | 4,000 |

3

## 3.4 මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශ විශ්ලේෂණය

### අ. මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2021 වර්ෂයේ මුළු ආරක්ෂක වියදම් වෙනුවෙන් ලං.රු.මි. 51,604.59 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ආරම්භයේදීම ලැබී ඇත. අතිරේක මෙහෙයුම් වියදම් සඳහා ලං.රු.මි 5,536.26 ක අතිරේක ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව 2021 වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි. 57,140.85 කි. වර්ෂය සඳහා මුළු තත්‍ය ආරක්ෂක වියදම වුයේ ලං.රු.මි 41,737.47 කි. මෙය නියෝජනය වන්නේ ලං.රු.මි 35,630.58 පුනරාවර්තන වියදම් ලෙස හා ලං.රු.මි 6,106.89 ක් මූලධන වියදම් ලෙසයි. කෙසේ නමුත්, මුළු ශුද්ධ ප්‍රතිපාදනය 29.17% කින් වැඩි වී ඇති අතර 2020 වර්ෂය සමඟ සැසඳීමේදී තත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස 2.86% කින් වැඩි වී ඇත. එසේ වුවත් 2021 වර්ෂයේ සමස්ථ ආරක්ෂක වියදම පාර්ලිමේන්තුවෙන් අනුමත මුළු ප්‍රතිපාදන තුළ පැවති අතර මුදල් අමාත්‍යාංශයේ මුළු පාලන වියදම් තුළද පැවතුනි.

**පසුගිය වර්ෂයට එරෙහිව සමස්ථ ආරක්ෂක වියදම සංසන්දනය කිරීම**

| මුළු ආරක්ෂක වියදම | වර්ෂය 2021 | වර්ෂය 2020 | විචල්‍යතාව |
|---|---|---|---|
| මුළු ප්‍රතිපාදන | 57,140.85 | 44,236.87 | 12,903.98 |
| මුළු වියදම | 41,737.47 | 40,578.62 | 1,158.85 |

වගුව - 1




රූප සටහන - 1

## ආ. මූල්‍ය කාර්ය සාධනය

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ එකතුකළ ආදායම ලං.රු.මි 39,537.57 කි. මෙයට ආදායම් ලැබීම් ලෙස ලං.රු.මි 10.57 ක් සහ ආදායම් නොවන ලැබීම් ලෙස ලං.රු.මි 39,527.00 ක් ඇතුළත්ය. 2020 වර්ෂය හා සැසඳීමේදී සමස්ථ එකතු කල ආදායම ප්‍රතිශතයක් ලෙස 1% කින් අඩුවී ඇත.

**පසුගිය වර්ෂයට එරෙහිව සමස්ථ එකතු කළ ආදායම**

| ආදායම | වර්ෂය 2021 | වර්ෂය 2020 | විචල්‍යතාව |
|---|---|---|---|
| සමස්ථ එකතුකළ ආදායම | 39,537.57 | 39,933.15 | 395.58 |

වගුව - 2




රූප සටහන - 2

(1) ආදායම් ලැබීම්

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හුදු ආදායම් ලැබීම් වන්නේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම්ය. ගුවන්යානා කුලී ගාස්තු පමණක් බදු නොවන ආදායම් වලට ඇතුළත් වන අතර 2021 වර්ෂය ආරම්භයේදී එය ලං.රු.මි. 120.00 ක් ලෙස මුලිකවම ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ නමුත් 2021 වර්ෂය තුළදී ඇස්තමේන්තුගත වටිනාකම ලං.රු.මි. 10.50 ලෙස සංශෝධනය කර ඇත. හිඟ ආදායම් ද ඇතුළුව එකතු කළ සමස්ථ ගුවන්යානා කුලී ආදායම ලං.රු.මි 10.57ක් බවට සටහන් විය.

**පුරෝකථනය කළ ආදායමට එරෙහිව තත්‍ය ආදායම**

| ආදායම් කේතය | 2021 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ගත ආදායම(ලං.රු.මි) | 2021 වර්ෂයේ තත්‍ය ආදායම (ලං.රු.මි) | වෙනස (ලං.රු.මි) |
|---|---|---|---|
| 20-03-02-16 | 10.50 | 10.57 | 0.07 |

වගුව - 3




**රූප සටහන - 3**

(2) ආදායම් නොවන ලැබීම්

2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ලැබීම් බහුතරයක් ආදායම් නොවන ලැබීම් වන අතර එහි එකතුව ලං.රු.මි 39,527.00 එය 2020 වර්ෂය හා සැසඳීමේදී ලං.රු.මි 18.20 කින් අඩු වී ඇත. ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාර අග්‍රිම, තැන්පතු, අත්තිකාරම් ගිණුම සහ වෙනත් ලැබීම් ලෙස පිළිවෙලින් ලං.රු.මි 39,161.50 , ලං.රු.මි 49.49, ලං.රු.මි.316.01 ඇත.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වියදම්

2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම ලං.රු.මි 42,149.56 (ප්‍රධාන ලෙජර් වියදම් ද ඇතුළුව) වන අතර එයින් ලං.රු.මි 35,630.58 පුනරාවර්තන වියදම් ලෙසත්, ලං.රු.මි 6,106.89 ක් මූලධන වියදම් ලෙසත් සහ ලං.රු.මි. 412.09 ක් ප්‍රධාන ලෙජර් වියදම් ලෙසත් වියදම් දරා ඇත. ඒ අනුව පෙර වර්ෂය හා සැසඳීමේදී 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම 1.82% කින් වැඩි වී ඇත.

**පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ මුළු වියදම**

| වියදම | 2021 වර්ෂය | 2020 වර්ෂය | විචල්‍යතාව |
|---|---|---|---|
| තත්‍ය වියදම | 42,149.56 | 41,111.64 | 1,037.92 |

**වගුව - 4**




**රූප සටහන - 4**

(4) පුනරාවර්තන වියදම්

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 39,948.10 ක මුදලක් වෙන් කර තිබෙන අතර ඊට පුද්ගල වැටුප් ලෙස ලං.රු.මි 30,672.40 ක් හා අනෙකුත් පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 9,275.70ක් ඇතුළත්ය. 2021 වර්ෂය තුළ අතිරේක ප්‍රතිපාදන ලෙස ලං.රු.මි 20.00 ලබාදී තිබෙන අතර මුරෙ 66 හා 69 ප්‍රකාරව ලං.රු.මි 350.00 මාරු කිරීම් සිදු කර ඇත. ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය ලං.රු.මි 39,618.10 ක් වන අතර තත්‍ය වියදම ලං.රු.මි 35,630.58කි. රජයේ ප්‍රතිපාදන මඟින් මුළු ඇස්තමේන්තුව සඳහා අරමුදල් සැපයීමට අපේක්ෂා කර ඇත. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ මුළු ඇස්තමේන්තුගත වියදම පහත සඳහන් වියදම් අයිතමයන් සඳහා වේ.

| | ලං.රු.මි |
|---|---|
| පුද්ගල වේතන | 30,672.40 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 9,275.70 |
| අතිරේක ප්‍රතිපාදනය | 20.00 |
| මුරෙ 66 හා 69 ප්‍රකාරව සිදු කළ මාරු කිරීම් | (350.00) |
| **සංශෝධිත පුනරාවර්තන ප්‍රතිපාදනය** | **39,618.10** |

**පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ පුනරාවර්තන වියදම්**

| පුනරාවර්තන වියදම් | 2021 වර්ෂය සඳහා | 2020 වර්ෂය සඳහා | විචල්‍යතාව |
|---|---|---|---|
| සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය | 39,618.10 | 37,746.70 | 1,871.40 |
| සමස්ථ වියදම | 35,630.58 | 36,225.05 | (594.47) |

**වගුව - 5**




**රූප සටහන - 5**

(5) ප්‍රාග්ධන වියදම්

(අ) අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ සේවා පුද්ගලයින්ගේ හා සිවිල් සේවක මණ්ඩලයේ හැකියාව වර්ධනය යනාදිය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 11,656.49 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලැබී ඇත. ලං.රු.මි 5,516.26 අතිරේක ප්‍රතිපාදන ලෙස ලබාදී ඇති අතර මුරෙ 66 හා 69 ප්‍රකාරව ලං.රු.මි 350.00 ක් මාරු කිරීම් සිදුකර ඇත. භාණ්ඩාගාරය විසින් අනුමත කළ මුළු ප්‍රාග්ධන ප්‍රදානය ලං.රු.මි 17,522.75කි. 2020 වර්ෂය සමඟ සැසඳීමේදී 2021 වර්ෂයේ සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය 170% කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව 2021 වර්ෂයේ සංශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදනය පහත පරිදිය.

| | ලං.රු.මි |
|---|---|
| මූලික ප්‍රතිපාදනය | 11,656.49 |
| අතිරේක ප්‍රතිපාදනය | 5,516.26 |
| මුරෙ 66 හා 69 ප්‍රකාරව සිදු කල මාරු කිරීම් | 350.00 |
| **සංශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදනය** | **17,522.75** |

**පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ ප්‍රාග්ධන වියදම්**

| ප්‍රාග්ධන වියදම | 2021වර්ෂය සඳහා | 2020 වර්ෂය සඳහා | විචල්‍යතාව |
|---|---|---|---|
| සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය | 17,522.75 | 6,490.17 | 11,032.58 |
| සමස්ථ වියදම | 6,106.89 | 4,353.57 | 1,753.32 |

**වගුව - 6**




**රූප සටහන - 6**

(ආ) තවද, 2021 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි. 6,106.89 ක් වන අතර එය 2020 වර්ෂය හා සැසඳීමේදී 40% ක ඉහල යාමකි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම වර්ෂය තුළ ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය අරමුණු කොට ගෙන ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ලං.රු.මි 3,887.00 ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. ලං.රු.මි 3,196.26 අතිරේක ප්‍රතිපාදන ලෙස ලබාදී ඇති අතර මුරෙ 66 හා 69 ප්‍රකාරව මාරු කිරීම් සිදුකර නැත. 2021 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 4,154.97කි.

(ඈ) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ප්‍රධාන වශයෙන්ම වාහනවල ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ හා බඩු භාණ්ඩ සපයා ගැනීම හා බර යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම ඇතුළු ලං.රු.මි 6,174.49 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ආරම්භයේදී ප්‍රතිපාදන සලසා දී තිබුණි. ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් ලං.රු.මි 6,174.49 ක මුල් ප්‍රතිපාදන වෙන් කිරීමක් සඳහා අනුමැතිය ලබා දී ඇත. ලං.රු.මි 2,175.00 ක අතිරේක ප්‍රතිපාදන ලබාදී ඇති අතර ශුද්ධ ප්‍රතිපාදනය ලං.රු.මි 8,699.49 බවට පත්කරමින් මුරෙ 66 හා 69 ප්‍රකාරව ලං.රු.මි 350.00ක් මාරු කිරීම් සිදුකර ඇත. 2021 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 1,265.63 කි.

(ඉ) හැකියා වර්ධනය

මූලධන වියදම් යටතේ,ශ්‍රී ලංකා ගුවන් හමුදාව හැකියා වර්ධනය සඳහා ලං.රු.මි 570.00 ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. 2021 වර්ෂය තුළ තත්‍ය වියදම ලං.රු.මි. 279.41 කි.

(ඊ) වෙනත් ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් යටතේ, ලං.රු.මි 1,170.00ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව වෙනත් ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 406.89ක මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වියදම් දරා ඇත.

(උ) වියදම් වර්ග කිරීම් යටතේ ප්‍රතිපාදන වලට එරෙහිව පුනරාවර්තන වියදම්

| කාර්ය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය (ලං.රු.මි) | වියදම (ලං.රු.මි) | වෙනස |
|---|---|---|---|
| පුද්ගල වේතන | 30,676.40 | 29,322.35 | 1,354.05 |
| වෙනත් පුනරා-වර්තන | 8,941.70 | 6,308.23 | 2,633.47 |
| **එකතුව** | **39,618.10** | **35,630.58** | **3,987.52** |

**වගුව - 7**




**රූප සටහන - 7**

(උ) වාර්ෂික විසර්ජන ගිණුම් වලට අදාළව ප්‍රාග්ධන වියදම් වර්ග යටතේ ප්‍රතිපාදන (එක් එක් වැය විෂය යටතේ) වලට එරෙහිව වියදම් දැරීම.

| වැය විෂය | කාර්ය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (ලං.රු.මි) | වියදම (ලං.රු.මි) | වෙනස (ලං.රු.මි) |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 200.00 | 148.93 | 51.07 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 6,708.26 | 3,927.70 | 2,780.56 |
| 2003 | වාහන | 175.00 | 78.34 | 96.66 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | | | |
| 2101 | වාහන | 3,262.49 | 370.15 | 2,892.34 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 107.00 | 84.15 | 22.85 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,485.00 | 525.69 | 2,959.31 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,845.00 | 285.64 | 1,559.36 |
| | ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 570.00 | 279.41 | 290.59 |
| | වෙනත් ප්‍රාග්ධන වියදම් | | | |
| 2509 | වෙනත් | 1,170.00 | 406.89 | 763.11 |
| **එකතුව** | | **17,522.75** | **6,106.90** | **11,415.85** |

**වගුව - 8**




**රූප සටහන - 8**

(එ) අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් නියම කළ සීමාවන්ට එරෙහිව තත්‍ය සීමාවන්

රාජ්‍ය නිලධාරීන්ට ණය ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එක් අත්තිකාරම් ගිණුමක් ඇත. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අත්තිකාරම් ගිණුමේ නියමිත සීමාවන්ට අනුකූලව කටයුතු කර ඇති අතර මෙම ගිණුමේ මෙහෙයුම් පහත පරිදිය.

| විස්තරය | පවත්නා වර්ෂයේදී නිර්දේශිත සීමාවන් (ලං.රු.මි) | පවත්නා වර්ෂයේ තත්‍ය වියදම (ලං.රු.මි) | වෙනස (ලං.රු.මි) |
|---|---|---|---|
| **අංක:22401 අත්තිකාරම් "බී" ගිණුම** | | | |
| උපරිම වියදම් සීමාව | 400.00 | 349.78 | 50.22 |
| අවම ලැබීම් සීමාව | 290.00 | 316.01 | 71.01 |
| උපරිම හර සීමාව | 1,000.00 | 301.60 | අදාළ නොවේ |

**වගුව - 9**




**රූප සටහන - 9**

(ඒ) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මුල්‍ය ප්‍රකාශන

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මුල්‍ය ප්‍රකාශන, ගිණුම් නිලධාරී හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පිළිවෙලින් 2022 පෙබරවාරි 22 හා 23 දිනවලදී අනුමත කරන ලදී.

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය



ඒකක - 1

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරි : ගුවන් හමුදාධිපති
වියදම් ශීර්ෂ අංකය : 224

රු.

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | ආදායම් ඇස්තමේන්තුවට (1) | | ආදායම් රැස්කිරීම් (2) | | | (3) | ආදායමෙන් අයකළ වෙනස්කම් (4) | | | (5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුවට | සංශෝධිත ඇස්තමේන්තුවට | අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු මඟින් රැස්කිරීම් | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මඟින් රැස්කිරීම් (SA-21) | එකතුව | සීමා ආදායම් රැස්කිරීම් | මූල්‍ය | වැරදි නිවැරදි කිරීම් | එකතුව | ඉදිරි ආදායම් |
| | | 1(i) | 1(ii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+2(ii) | (3) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+4(ii) | 5=2(iii)+(3)-4(iii) |
| 2003.02.16 | ගුවන්යානා බදු ආදායම් | 120,000,000 | 10,500,000 | 10,574,308 | - | 10,574,308 | - | - | - | - | 10,574,308 |

ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මූල්‍ය)
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 31.03.2022

ජේ. ඒ. ඩී. ඩී. ඒ. කුමාරසේලි
අධ්‍යක්ෂ (මූල්‍ය)
ශ්‍රී ලංකා ගණකාධිකාර් සේවය
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ආදායම් ගණෙන්දීමේ නිලධාරි
ගුවන් හමුදාධිපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2022.03.22

එස් සේ පතිරණ
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

7

වගුව - 10

## 3.7 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(ලං.රු.මි)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිප-ාදන | | |
| පුනරා-වර්තන | 39,948.10 | 39,618.10 | 35,630.58 | 89.94% |
| ප්‍රාග්ධන | 11,656.49 | 17,522.75 | 6,106.89 | 34.85% |

වගුව - 11

## 3.8 මුරෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(ලං.රු.මි)

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 01 | ජනාධිපති ලේකම් කාර්යාලය | ජනාධිපති මාධය ඒකකයේ ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | 50.00 | 50.00 | 42.49 | 84.98 |
| 02 | | ජනාධිපති කාර්යාලීය උපකරණ මිල දී ගැනීම | 18.00 | 18.00 | 4.76 | 26.47 |
| 03 | | දත්ත උපකරණ මිළ දී ගැනීම | 2.20 | 2.20 | - | - |
| 04 | බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ඔලබොදුව ජයවර්ධනාරාම විහාරස්ථානය සංවර්ධනය | 1.45 | 1.45 | 1.45 | 99.99 |
| 05 | | කණුගහවැව අභිනවාරාම විහාරස්ථානය සංවර්ධනය | 1.59 | 1.59 | 1.51 | 94.75 |
| 06 | ආරක්ෂක අමාත්‍යාංශය | ස්ථාන මාරු - සුභසාධන වැඩසටහන් රණවිරු මාපිය සුභසාධන වැඩසටහන | 298.82 | 298.82 | 298.37 | 99.85 |
| 07 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් අමාත්‍යාංශය | රජයේ නිවාඩු බංගලා අළුත්වැඩියා කිරීම - අංක B 20 | 0.50 | 0.50 | 0.41 | 82.03 |
| 08 | | රජයේ නිවාඩු බංගලා අළුත්වැඩියා කිරීම - අංක B 20 | 0.58 | 0.58 | 0.10 | 17.38 |
| 09 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | බන්ධනාගාර මූලස්ථානය | 0.93 | 0.93 | 0.67 | 72.03 |
| 10 | | බූස්ස බන්ධනාගාර - CCTV ව්‍යාපෘතිය | 2.50 | 2.50 | 2.21 | 88.47 |
| 11 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | කණුගහවැව ප්‍රාථමික පාසැල සංවර්ධනය | 1.13 | 1.13 | 0.62 | 54.28 |
| 12 | | හල්මිල්ලෑව පාසැල සංවර්ධනය | 9.01 | 9.01 | 7.22 | 80.13 |
| 13 | | ආරක්ෂක විද්‍යාලය-කොළඹ | 12.50 | 12.50 | 11.73 | 93.84 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ආරක්ෂක විද්‍යාලය - කොළඹ (TP සහ කැමරා) | 1.04 | 1.04 | 1.00 | 95.04 |
| 15 | වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි සහ මෝටර් රථ කර්මා-න්තය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය | පුනරාවර්තන මාරුකිරීම් නිවාඩු දුම්රිය බලපත්‍ර | 105.00 | 105.00 | 4.37 | 4.16 |
| 16 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | මාරු වීම් - සුභසාධන වැඩසටහන් (මියගිය, ආබාධිත අය සඳහා දීමනාව) | 507.40 | 507.40 | 506.11 | 99.75 |
| 17 | | මාරුවීම්-සුභසාධන වැඩසටහන් (පාරිතෝෂිකය) | 26.51 | 26.51 | 26.51 | 100.00 |

වගුව - 12

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(ලං.රු.මි)

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ඉදිකිරීම් | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී | 14,816.33 | Nil | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 63,740.83 | Nil | 100% |
| 9153 | ඉඩම් | | 37,352.46 | Nil | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 516.52 | Nil | 100% |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | - | - |

වගුව - 13

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } සිවිවප/සී/ලංසල්ප්‍රගත/21/17 } ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2022 ජූනි 07 දින

ගුවන් හමුදාපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණනාධිපති පරීක්ෂණ වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වංගණනය කළ මණ්ඩය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ කතුරුන් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණනාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.




+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | auditorgeneral.gov.lk | www.naod.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුදල් ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මුදල් තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පෙදෙසේ පිළිගත් නිෂ්පාදනකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාරෝචනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මුදල් ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මුදල් ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නීලධාරීගේ හා ගණන්දීමේ නීලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් නිෂ්පාදනකරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මුදල් ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නීලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා තබාත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මුදල් තැලනය සඳහා සවලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නීලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සවලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය සවලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය මිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදී හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදී තනි හෝ සමූහීත ලෙස බලපෑම් නීතා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකශුභාවයන් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කළදරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදී හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුෂ්කන්ධානයෙන්, වාසිය ලෙස්සන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මත නැවීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය සිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතයට ගිණුම් ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ අදාළ ගිණුම් ඇස්තමේන්තු හා ඒවාට සම්බන්ධ අනාවරණ අධ්‍යයනය කරන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල වලංගුභාවය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ඇතුළත් වී ඇති බව සහ භාවිතයට ගිණුම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මංගේ විගණනය කුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, පුධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය පුකාරව පහත සඳහන් කරුණු මා පුකාශ කරමි.

(අ) මුදල් පුකාශන ඉකුත් වර්ෂය සම්බන්ධ අනුරූප වන බවද ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුදල් පුකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ කියාත්මක කර නොතිබුණි.

| ඡේද අංකය | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2019 154(6) වාර්තාව 3.6 (ආ) | 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය පුකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා යහ අරමුදල් ඔගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගනෙ නිබුණි . මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද නවදුරටත් නිරීක්ෂණය විය . | ශ්‍රී ලංකා ගුවන්හමුදා සම්පවාදී ජනරාල්ගේ දාණ්ඩුකුම වගවීම්වාරවේ විවිධධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජස්ව නිගුම්කාරක සභා රැස්වීමේ නියෝග පුකාර ලාභ උපයන ව්‍යාපෘති මුල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සහතේ නිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
